3.	රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
4.	රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
5.	රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට	1,200 0
6.	රු. 150,000 ඉක්මවන විට	3,000 0

12-246/4

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අයකිරීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු හා බැනර් ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව 2022.08.31 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අංක 1811 දරන 2013 මැයි මස 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 27 වන අතුරු ව්‍යවස්ථාවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, මාවතකට, ගොඩනැගිල්ලකට හෝ අහසට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර දැන්වීම් පුවරු, බැනර්, කටවුට් හා බිත්තිවල පින්තාරු කර ඇති දැන්වීම් වෙනුවෙන් පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් වර්ගයේ ප්‍රදර්ශනයන් වෙනුවෙන්, එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙ හි නිරූපිත ගාස්තු පනවා අය කිරීමටත්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නී ය."

i වැනි තීරුව	*ii වැනි තීරුව*			
දැන්වීම් වර්ගය	*වර්ග අඩියක් සඳහා අය කිරීම*			
	සතියක්	*සති 02-මාසයක්*	*මාස 01ට වැඩි*	*වර්ෂයක්*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*	*රු. ශත*
තාවකාලික බැනර් හා කටවුට්	15 0	20 0	25 0	30 0
බැනර් හා කටවුට් (ඉඩම් වෙන්දේසි හා දීප ව්‍යාප්ත ආයතන)	15 0	25 0		
ස්ථාවර දැන්වීම් පුවරු (බල ප්‍රදේශයේ පමණක් ස්ථාපිත ආයතන)				100 0
ස්ථාවර දැන්වීම් පුවරු (දීප ව්‍යාප්ත හෝ අන්තර්ජාතික සමාගම් හෝ ආයතන)				200 0
බිත්ති පින්තාරු				50 0
ඩිජිටල් ප්‍රචාරක පුවරු (ගුවන් හා ප්‍රතිදීප්ත නාම පුවරු)				1500 0
ප්‍රතිදීප්ත නොවන ආලෝක පුවරු				100 0

ප්‍රාදේශීය සභාව මගින් ඉවත් කරනු ලබන දැන්වීම් පුවරුවක් නැවත ලබා දීම සඳහා පහත ගාස්තු අය කරනු ලැබේ.

එක් බැනරයක් හෝ කටවුටයක් සඳහා	රු. 50 0
එක් ස්ථාවර දැන්වීම් පුවරුවක් සඳහා	රු. 5,000 0

12-246/5

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු බිම් තාවකාලික වෙළෙඳ කටයුත්තක් සඳහා බදු දීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා සභාව සතු බිම් තාවකාලික කටයුත්තක් සඳහා බදු දීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව 2022.08.31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ ඇති පරිදි බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු භූමිය තාවකාලිකව බදු දීම් සඳහා ගාස්තු පනවා අය කිරීමට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත යෝජනා කරන්නී ය."

උපලේඛනය

ස්ථානය	*වර්ග අඩි 1ක් සඳහා අයකිරීම*
	රු. ශත
වෑන් රථ ගාල	25 0
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව ඉදිරිපස භූමිය	10 0
බෙලිඅත්ත පොළ භූමිය	20 0
සභාව සතු වෙනත් ඕනෑම භූමියක්	දිනකට රු. 1,000 0
ත්‍රී රෝද රථ ගාල සඳහා	දිනකට රු. 5.00

12-246/6

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ක්‍රීඩා පිටි වෙන්කිරීමේ ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා සභාව සතු ක්‍රීඩාපිටි වෙන් කිරීමේ ගාස්තු අය කිරීමේ යෝජනාව 2022.08.31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අංක 1811 දරන 2013 මැයි මස 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 25 වන අතුරු ව්‍යවස්ථාවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා පිටි හා ක්‍රීඩාංගන වෙන් කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත්, මෙම වෙන්කිරීමේ ගාස්තු අයකිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නී ය."

අංකය	විස්තරය	ආරක්ෂිත ඇප රු. ශත	ගාස්තු රු. ශත
01	ක්‍රීඩාපිටිය මුදල් අයකරනු ලබන සංදර්ශනයකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	5,000 0	5,000 0
02	ක්‍රීඩාපිටිය නොමිලේ පවත්වනු ලබන සංදර්ශනයකට හෝ වෙනත් කටයුත්තකට භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,000 0
03	ක්‍රීඩාපිටිය ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයක් හෝ රාජ්‍ය නොවන ආයතනයක් මගින් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,000 0
04	ක්‍රීඩාපිටිය මෙම බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජයත් ක්‍රීඩා තරග/ තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට		1,000 0
05	ක්‍රීඩාපිටිය බල ප්‍රදේශයෙන් බැහැර ක්‍රීඩා තරගාවලියක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම් එක් දිනකට	2,000 0	2,000 0
06	ක්‍රීඩාපිටිය සැණකෙළියක් (කානිවල්) හෝ මුදල් අය කරනු ලබන වෙනත් කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන්නේ නම්	20,000 0	5,000 0

12-246/7

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ආදාහනාගාරය පාවිච්චි කිරීමේ ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා ආදාහනාගාරය පාවිච්චි කිරීමේ ගාස්තු පැනවීමේ යෝජනාව 2022.08.31 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යොජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති අංක 1811 දරන 2013 මැයි මස 13 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 23 වන අතුරු ව්‍යවස්ථාවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සතු ආදහනාගාරය පාවිච්චි කිරීමේ ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම වෙන් කිරීමේ ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අංකය	*විස්තරය*	*ගාස්තුව* *රු. ශත*
01	බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකුගේ දේහයක් ආදහනය සඳහා	12,000 0
02	බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවෙකුගේ දේහයක් ආදහනය සඳහා	14,000 0

12-246/8

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා පුස්තකාල ගාස්තු පැනවීමේ යෝජනාව 2022.08.31 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල 36 වැනි කොටසේ 'පුස්තකාල' පිළිබඳ අතුරු ව්‍යවස්ථාවෙන් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, මුල් වරට සාමාජිකත්වය ලබාගන්නා තැනැත්තෙකු වන විට පහත ගාස්තුන් ගෙවා සාමාජිකත්වය ලබා ගත යුතුය."

	විස්තරය	ගාස්තුව රු. ශත
01	අයදුම්පත් ගාස්තුව	25 0
02	ඇප තැන්පත් මුදල	200 0
03	පරිගණක කාඩ්පත සඳහා ගාස්තුව	200 0
04	වසර දෙකකට වරක් සාමාජිකත්වය අලුත් කිරීම සඳහා	25 0
	පාසල් සිසුන් සඳහා :	
05	අයදුම්පත් ගාස්තුව	25 0
06	ඇප තැන්පත් මුදල	100 0
07	පරිගණක කාඩ්පත සඳහා ගාස්තුව	200 0
08	වසර දෙකකට වරක් සාමාජිකත්වය අලුත් කිරීම සඳහා	25 0

ප්‍රමාදවන දිනකට අයකරනු ලබන ප්‍රමාද ගාස්තුව දින 01 සඳහා ශත 50 කි.

"මෙම තීරණය 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

12-246/9

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා විවිධ ගාස්තු පැනවීමේ යෝජනාව 2022.08.31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී ඉටු කරන පහත සඳහන් සේවා සඳහා වෙනත් ආනුෂංගික කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම සේවා ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බව බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය."

2021 ජූලි මස 08 වැනි දින අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 2 වැනි උපලේඛනය ප්‍රකාරව බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීමේ දී පෙරසැරි ගාස්තු අය කිරීම, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු අයකිරීම, අනුකූලතා සහතිකය නිකුත් කිරීමේ ගාස්තු අය කිරීම ''2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.''

අනු. අංකය	*සේවාව*	*ගාස්තුව රු. ශ.*
01	ඔප්පු සාරාංශ අයදුම්පත්	250 0
02	අතිරේක තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම	250 0
03	විටිරේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් සහ අයිතිය පිළිබඳ සහතිකයක්	600 0
04	වරිපනම් සහතිකයක් නිකුත් කිරීම	250 0
05	ඉඩම් අනුබෙදුම් අයදුම්පතක්	400 0
06	ගොඩනැගිලි අයදුම්පත්‍රය	400 0
07	නගරය තුළ හා පොදු ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය (දිනකට)	200 0
08	පෙර පාසල් අයදුම් පත්‍රය හා නිල ඇඳුම සඳහා	1000 0
09	අනතුරුදායක ගසක් ඉවත් කිරීම (කොස් ගස් හැර)	300 0
10	අනතුරුදායක ගසක් ඉවත් කිරීම (කොස් ගස් සඳහා)	550 0

12-246/10

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ කුළියට දීමේ යෝජනාව 2022.08.31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් යන්ත්‍රෝපකරණ කුළියට ලබා දී සේවා සැපයීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු බවත් මෙම කුළියට දීම මත ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	යන්ත්‍රෝපකරණ වර්ගය	*බල ප්‍රදේශය* රු. ශත	*බල ප්‍රදේශයෙන් බැහැර* රු. ශත
01	බැක්හෝ යන්ත්‍රය	5,000 0	6,000 0
02	මෝටර් ග්‍රේඩරය	6,500 0	7,000 0
03 *(අ)*	ජල බවුසරය (ට්‍රැක්ටර්)		
	1. ජල සැපයුම	3,000 0	3,500 0
	2. ප්‍රවාහනය (කි. මී. 01 ක් සඳහා)	50 0	50 0
	3. රැඳවුම	500 0	500 0
(ආ)	ලොරි ජල බවුසරය		
	1. ජල සැපයුම	5,000 0	6,000 0
	2. ප්‍රවාහනය (කි. මී. 01 සඳහා)	50 0	50 0
	3. රැඳවුම	500 0	500 0
04	ගලි බවුසරය		
	1. බවුසර් ගාස්තු	5,000 0	6,500 0
	2. ප්‍රවාහනය (කි. මී. 01 ක් සඳහා	50 0	50 0
05	රෝලර් යන්ත්‍රය	6,500 0	7,000 0
06	ට්‍රිපර් රථය (දිනකට)	12,000 0	12,000 0

12-246/11

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව 2022.08.31 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (vi) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

"267 වැනි අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ කාර්යය සඳහා වන කිසියම් විනෝද කටයුත්තක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව තුළ සිදුකරන සෑම අවස්ථාවකදීම එම කටයුත්ත සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන් ගෙන් අය කර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතක (7%) ප්‍රමාණයට සමාන මුදලක් ද, වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තන්ගෙන් අය කරගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ප්‍රමාණයට සමාන මුදලක් ද ඉහත කී විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන ආයතනවලට ලැබී ඇති බලතල ප්‍රකාර විනෝද බද්ද වශයෙන් පනවා අයකර ගත යුතු බවත් එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර එකී විනෝද බද්ද බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-246/12

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමේ යෝජනාව 2022.10.27 දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (ix) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද ස්ථීර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වූ

(අ) 146 වන වගන්තියේ 6 වන උපවගන්තිය ප්‍රකාරව 2022 වර්ෂයේ සත්‍යෝක්ෂණය 2023 වර්ෂයට පිළිගැනීමටත්

(ආ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2023 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්

(ඇ) හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර 5කට අඩු වූ සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා රුපියල් 10 බැගින් වන අක්කර බද්දක් පනවා අය කිරීමටත්; සහ

(ඈ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික 4 කින් ගෙවීමට විධාන කිරීමට ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-246/13

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසල බදු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීමේ යෝජනාව 2022.10.27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 08 (ix) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

යෝජනාව

දකුණු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2013.10.25 වැනි දින අංක 1,834 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV අ කොටසේ පළ කරනු ලැබූ පළාත් සභාවේ විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2014.10.17 දින අංක 1884/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV ආ කොටසේ පළ කරනු ලැබූ නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කසළ බදු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 දක්වා ක්‍රියාත්මක විය යුතු යැයි බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

උපලේඛනය

දුර ප්‍රමාණය	*මසකට අය කිරීම (රු.)*
කි. මී. 05 දක්වා	500.00
වැඩිවන කි. මී. 01 ක් සඳහා	50.00

12-246/14

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ අංක 21 දරන අතුරු ව්‍යවස්ථාවේ අප්‍රසන්න හා අන්තරායදයක වෙළඳාම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව බලපත්‍ර මත ගාස්තු පැනවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳාම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව බලපත්‍ර මත ගාස්තු පැනවීම යෝජනාව 2022.10.27 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී යෝජනා අංක 08 (ix) යටතේ සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ නොවැම්බර් මස 10 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

අංක 520/7 දරන 1988 අගෝස්තු මස 23 වැනි දින පළාත් සභා විෂය භාර අමාත්‍යවරයා ප්‍රකාශයට පත් කරන ලද අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 21 දරන අතුරු ව්‍යවස්ථාවේ අප්‍රසන්න හා අන්තරාදයක වෙළඳාම යන අතුරු ව්‍යවස්ථාවේ අනු අංක 1 දරන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව එම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන යන්නෙන් සඳහන් කර ඇති ස්ථානයට අංක 01 උපලේඛනය යන්නෙන් අන්තරායදයක වශයෙන් අංක 1 සිට 9 දක්වාද, අංක 2 උපලේඛනය අප්‍රසන්න වශයෙන් අංක 1 සිට 4 දක්වාද, අංක 03 උපලේඛනය අප්‍රසන්න/අන්තරාදයක වශයෙන් අංක 1-2 දක්වා ද උපලේඛන ප්‍රකාශයට පත් කර යුතු බව ද සභාවට යෝජනා කරන්නීය.

අංක 1 උපලේඛනය

අන්තරාදයක

i. කළුගල් වලක් පවත්වාගෙන යාම
ii. කළුගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
iii. වී මෝලක් පවත්වාගෙන යාම
iv. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම
v. ලී මෝලක් පවත්වාගෙන යාම
vi. කොහු මෝලක් පවත්වාගෙන යාම
vii. යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම
viii. වෙල්ඩින්, ලියවන පට්ටල්
ix. වෝල්කනයිසින් ස්ථානයක් පවත්වාගෙන යාම

අංක 2 උපලේඛනය

අප්‍රසන්න

i. වාහන පින්තාරු, ස්ථානයක් පවත්වාගෙන යාම
ii. කොම්පෝස්ට් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම
iii. සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම
iv. පෙරමුසු තාර මිශ්‍ර කිරීම

අංක 3 උපලේඛනය

අන්තරාදයක/අප්‍රසන්න

i. ඇඟළුම් කර්මාන්ත ශාලා
ii. වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කුළී රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (01) viii.a යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 vii (ඌ) උපවගන්තිය ප්‍රකාරව 2023 වර්ෂය සඳහා අනුමත කුළී රථ වාහන නැවතුම් ස්ථාන සඳහා කුළී රථ වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		වාර්ෂික බලපත්‍ර ගාස්තු ප්‍රමාණය රු. ශත
1.	ලොරියක් සඳහා	1,500 0
2.	වෑන් රථයක් සඳහා	1,000 0
3.	බස් රථයක් සඳහා	1,500 0
4.	ත්‍රී රෝද රථයක් සඳහා	1,000 0
5.	මෝටර් රථ සඳහා	1,000 0
6.	වෙනත් බර වාහන සඳහා	1,500 0

12 - 304/1

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අයාලේ යන ගවයින් හා සතුන් සඳහා ගාස්තු අය කිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (01) viii.b යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන මාර්ගවල හා නගර ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම්වලට දවසේ ප.ව. 6.00ත් පෙ.ව. 6.00ත් අතර කාලසීමාවේ දී නිදැල්ලේ යවනු ලබන එළ ගවයින්, මී ගවයින්, ඌරන්, එළුවන් ආදී සතුන් ගෙන් වන හානි විශාල බැවින්, ප්‍රදේශයේ ජනයාට සිදුවන ආපදාවන් වැළැක්වීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66(1), (2),(3) වැනි වගන්තිවලට අනුකූලව ගවයින් හා සතුන් ඇල්ලීමටත්,

එසේ අයාලේ යන සතුන් හට 2023 වර්ෂය සඳහා පහත ආකාරයට ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1. අයාලේ යන එක් සතෙකු සඳහා දිනකට රු. 1,000.00 ක ගාස්තුවක් ද,
2. ගාල් කර තබන්නා වූ එක් දිනක් සඳහා රු. 100.00 ක ගාස්තුවක් ද,
3. අල්ලාගනු ලබන සතෙකු දින 10 ක් ඇතුළත නිදහස් කර ගැනීමට අපොහොසත් වුවහොත් එකී සත්වයන් සභාව මගින් වෙන්දේසිකර සියලු වියදම් අයකර ගැනීමට කටයුතු කෙරේ.

12 - 304/2

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්ද පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.c යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී පහත උපලේඛනයේ i වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබාගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි ii තීරුවේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා අයකළ යුතු යැයි ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව* රු. ශත
(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් -	
බයිසිකල් (පා පැදි)	60 0
ත්‍රිරෝද රථ	1,000 0
සෑම කරත්තයක් සඳහා	12 0
ගොනුන් බඳින කරත්තයක් සඳහා	24 0
වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන වෙනත් වාහන	1,000 0

12 - 304/3

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සුසාන භූමි ආඥාපනත යටතේ ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (01) viii.d යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥාපනතේ 03 වැනි වගන්තිය හා 17 සිට 22 වැනි වගන්තිය අනුව එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව තුළ මතු දැක්වෙන උපලේඛනයේ සඳහන් සුසාන භූමිවල භූමදානය කිරීම, ආදාහනය කිරීම හා තැන්පත් කිරීම, හා ස්මාරක ඉදිකිරීම සඳහා, පහත සඳහන් ආකාරයට ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. භූමදානය කිරීම (ඕනෑම වයස් කාණ්ඩයකට නිදහස් ය)
02. තැන්පත් කිරීම සඳහා (අඩි 6 x 3) රු. 1,500
03. ස්මාරක ඉදිකිරීම (අඩි 10 x 3) රු. 1,750

12 - 304/4

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (01) viii.e යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී ව්‍යාපාර බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
2022 වාර්ෂික ආදායම	*රු. ශත*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන එහෙත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන එහෙත් රු.1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12-304/5

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක (01) viii.f යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් පනවා අය අයකළ යුතු බවටත්, එකී බලපත්‍ර ගාස්තුවට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය	*කර්මාන්තය*	*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම*		
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	ආපන ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	මස් ගබඩා කිරීම හා පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	මාළු ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0
06.	ලැඟුම් නිවාස පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	හෝටල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	බත් කඩ පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කොණ්ඩා සැකසීමේ සැළුන් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසල බදු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.g යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව පනතේ 3 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(3) උපවගන්තිය ප්‍රකාරව 2016.02.05 වැනි දින මා විසින් වැළඳගන්නා ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ලග්ගල-පල්ලේගම නගරය තුළ කසල බැහැර කරනු ලබන පරිශ්‍රයන් තුළින් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එකී උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප තීරුවේ නිරූපිත අනුප්‍රමාණයක වූ මාසික කසල බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II* වැනි තීරුව රු. ශත
1.	වෙළඳ ව්‍යාපාරික ස්ථාන	400 0
2.	රාජ්‍ය ආයතන	600 0
3.	ආපන ශාලා	1000 0

12 - 304/7

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අනු පිටපත් නිකුත් කිරීම සඳහා ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.h යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අනු පිටපත් නිකුත් කිරීම සඳහා 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

			රු. ශත
01.	අනුමත ගොඩනැගිලි සැළසුමේ අනු පිටපත් නිකුත් කිරීම	-	1000 0
02.	වීථිරේඛා සහතිකයේ අනු පිටපත් නිකුත් කිරීම	-	500 0
03.	අනුකූලතා සහතික අනු පිටපත් නිකුත් කිරීම	-	500 0

12 - 304/8

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අයදුම්පත්‍ර සඳහා ගාස්තු අය කිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.i යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කරනු ලබන බලපත්‍ර බදු අය කිරීමේදී ලබා දෙනු ලබන අයදුම්පත්‍ර සඳහා පහත සඳහන් ගාස්තු 2023 වර්ෂය සඳහා අයකිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

			රු. ශත
01.	වෙළඳ බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	-	100 0
02.	ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු	-	250 0
03.	වීථිරේඛා අයදුම්පත්‍ර ගාස්තු	-	250 0
04.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	-	200 0
05.	ටෙන්ඩර අයදුම්පත්‍ර ගාස්තු	-	100 0
06.	පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	-	200 0
07.	කසළ බදු බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	-	100 0
08.	ජල සම්බන්ධතා අයදුම්පත්‍ර ගාස්තු	-	100 0
09.	පිඹුරුපත් අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	-	200 0
10.	මැණික් පතල් සඳහා බදු අයකිරීමේ අයදුම්පත්‍ර ගාස්තු	-	100 0
11.	පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු	-	100 0

12 - 304/9

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ප්‍රචාරක ඇගයීම් හා දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.j යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2016.02.23 වැනි දින 1955/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කිරීමෙන් අනතුරුව නිවේදනය කරනු ලද්දාවූ ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව 2017.12.29 වැනි දින එම අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර නිවේදනය කරනු ලැබූ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව පහත සඳහන් ලෙස 2023 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු අංකය	*ප්‍රචාරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු *රු. ශත*	*මාස 03 හෝ 06 අතර* *රු. ශත*	*වසරක් සඳහා* *රු. ශත*
01	කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරණය කරනු ලබන දැන්වීමක් සඳහා	01 ට අඩු	250 0	350 0	500 0
		01 ට වැඩි	01ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 0 බැගින්		
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	03 ට අඩු	250 0	350 0	500 0
		03 ට වැඩි	03ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 0 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	01 ට අඩු	500 0	750 0	1,000 0
		01 ට වැඩි	01ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 0 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	01 ට අඩු	500 0	750 0	1,000 0
		01 ට වැඩි	01ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 0 බැගින්		

12-304/10

ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා පුස්තකාල සඳහා ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.k යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් කරනු ලදුව 2016.02.23 වැනි දින 1955/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ *ගැසට් පත්‍රයේ* iv (ඇ) වැනි කොටසේ පළකරනු ලැබූ හා මධ්‍යම පළාත් සභාව විසින් අනුමත කොට 2017.05.05 වැනි දින 2017/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ඇ) වැනි කොටසේ පළ කිරීමෙන් අනතුරුව නිවේදනය කරනු ලද්දා වූ ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය විසින් එම අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව 2017.12.29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර නිවේදනය කරනු ලැබූ මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව 2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

			රු. ශත
01.	ළමා සාමාජික ගාස්තු (වයස අවුරුදු 14ට අඩු හා 03ට වැඩි)	-	100 0
02.	වැඩිහිටි සාමාජික ගාස්තු (වයස අවුරුදු 14ට වැඩි)	-	200 0
03.	සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගාස්තු	-	50 0
04.	ප්‍රමාද දිනයක් සඳහා අයකරන දඩ මුදල් එක් දිනයක් සඳහා - එක් පොතකට	-	02 0

12 - 304/11

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01)viii.l යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

විනෝද බදු ආඥාපනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ 2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි විනෝද බදු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. ඕනෑම සංදර්ශනයකට විකුණනු ලබන ප්‍රවේශපත්‍ර වටිනාකමින් 20% විනෝද බද්දක් අය කිරීම,

02. දර්ශනයක් පෙන්වන එක් දිනයක් සඳහා රුපියල් 500 ගාස්තුවක් අය කිරීම.

12 - 304/12

ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.m යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි ii වැනි තීරුවල ස්ථානීය අගයයන් මත අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අනු. අංකය		*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	පූජා භාණ්ඩ, රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	පොත්පත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	සිංහල බෙහෙත් ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	සිමෙන්ති ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	මණිබඩු හෝ සුවඳ විලවුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	තේ ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ගඩොල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	යන්ත්‍රෝපකරණ භාවිතා නොකරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	දැව ගබඩාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	රෙදි මුද්‍රණය කිරීමේ හෝ සායම් දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	මුද්‍රණාලයක් (අතින් ක්‍රියාකරවන) පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	හිස් බෝතල් හෝ ගෝනි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	II වැනි තීරුව	
අනු අංකය		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු.1,500 ඉක්මවන අවස්ථාවක
		රු. ශත	රු. ශත	රු. ශත
24.	පරණ පුවත්පත් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	මිනීපෙට්ටි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26.	ගැලුම් 25කට වැඩි ප්‍රමාණයක් පොල් තෙල් ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
27.	විකිණීම සඳහා ඇස්බැස්ටෝස් තහඩු තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28.	සුරුට්ටු එතීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29.	බීඩි එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30.	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	කබොක්, බොරළු, ගල්, වැලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	පොල් තෙල් සහ වෙනත් එළවළු තෙල් ගැලුම් වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
33.	අළුත් හෝ පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් 20ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
34.	පොල්කටු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
35.	පුන්නක්කු ටොන් 01කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
36.	විකිණීම සඳහා මිරිදිය මසුන් කොටුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38.	වී මැනීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	වළං සෑදීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර ඇතුළු විදුලි උපකරණ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42.	ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43.	දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44.	එළවළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45.	භූමිතෙල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46.	පරිගණක පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47.	දුරකතන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම, සී. ඩී. තැටි කුළියට දීම හා විකිණීම, ජංගම දුරකතන හා අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48.	සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
49.	රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
50.	කොන්ක්‍රීට්, මැටි පයිප්ප හෝ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	බිත්තර සඳහා කිකිළියන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
52.	මස් පිණිස කුකුළන්, කිකිළියන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
53.	යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
54.	බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
55.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
56.	මෝටර් වාහන පමණක් අළුත්වැඩියා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	මෝටර් සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු අංකය		*I වැනි තීරුව*	*II වැනි තීරුව*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු.1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
60.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
61.	ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	ගිණිකෙළි භාණ්ඩ හා රතිඤ්ඤා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් හෝ සායම් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
65.	ජී. අයි. තහඩුවලින් උපකරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
66.	පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	පුවක් සැකසීමේ හෝ ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
68.	සිරප් හෝ රසායනික පළතුරු බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	කරවල, ලුණු ජාඩි හෝ මාළු ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
70.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග නිෂ්පාදනය කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	මැණික්, බනිජ ද්‍රව්‍ය මිලදී ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
72.	යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ බෙහෙත් ද්‍රව්‍ය ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
73.	වී කෙටීමේ හා ධාන්‍ය වර්ග ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
75.	විනාකිරි විකිණීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
76.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	ව්‍යාපාර සඳහා කොන්ක්‍රීට් නිෂ්පාදන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	විකිණීම සඳහා පැණි නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	දිය හුණු (වෛටින්) හුණු හෝ හිරිගල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	එනසාල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
81.	දුම්කොළ වේළීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
82.	ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
83.	පෙට්‍රල්, ඩීසල් හෝ බනිජ ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
84.	යන්ත්‍රානුසාරයෙන් සහල් ඇඹරීමේ සහ සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
85.	අළුහුණු, බෙලි හුණු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම	500 0	750 0	1,000 0
86.	සිංහල බෙහෙත් ද්‍රව්‍ය සහ බුලත් පුවක් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
87.	ඇස් පරීක්ෂාව සහ ඇස් කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
88.	සුළු අපනයන බෝග ඇසුරුම් කිරීම සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථාන	500 0	750 0	1,000 0

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ජල ගාස්තු පැනවීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.n යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සියලුම ජල යෝජනා ක්‍රමවලට අදාළ ජල පාරිභෝගිකයින්ගෙන් 2023 වර්ෂය සඳහා පහත සඳහන් පරිදි ජල ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

01. නේවාසික

ඒකක ගණන	*ඒකකයක් සඳහා ගාස්තුව රු. ශත*	*මාසික සේවා ගාස්තුව රු. ශත*
00-05	10.00	150.00
06-10	12.50	150.00
11-15	20.00	150.00
16-20	40.00	150.00
21-25	58.00	200.00
26-30	88.00	250.00
31-40	105.00	350.00
41-50	120.00	500.00
51-75	130.00	1,000 0
Over 75	140.00	1,000 0

02. ව්‍යාපාරික ස්ථාන

ඒකක ගණන	*ඒකකයක් සඳහා ගාස්තුව රු. ශත*	*මාසික සේවා ගාස්තුව රු. ශත*
00-25	75.00	250.00
26-50	100.00	250.00
51-75	125.00	500.00
76-100	125.00	500.00
101-200	150.00	750.00
201-500	200.00	250.00
501-1000	300.00	1,000.00
1001-2000	350.00	1,250.00
2001-4000	400.00	1,500.00
4001-10000	500.00	2,000.00
10001-20000	600.00	57,500.00
Over-20001	700.00	115,000.00

03. පාසල්/ආගමික ස්ථාන

ඒකක ගණන	*ඒකකයක් සඳහා ගාස්තුව රු. ශත*	*මාසික සේවා ගාස්තුව රු. ශත*
00-05	10.00	150.00
06-10	10.00	150.00
11-15	10.00	150.00
16-20	10.00	150.00
21-25	10.00	150.00
26-30	20.00	200.00
31-40	25.00	200.00
41-50	30.00	200.00
51-75	40.00	400.00
76ට ඉහළ	50.00	400.00

04. රෝහල්

ඒකක ගණන	*ඒකකයක් සඳහා ගාස්තුව රු. ශත*	*මාසික සේවා ගාස්තුව රු. ශත*
00-25	75.00	250.00
26-50	100.00	250.00
51-75	125.00	500.00
76-100	150.00	1,000.00
101-200	170.00	1,600.00
201-500	200.00	2,500.00
501-1000	300.00	4,000.00
1001-2000	400.00	7,500.00
2001-4000	500.00	12,500.00
4001-10000	600.00	25,000.00
10001-20000	700.00	50,000.00
20001 ට ඉහළ	1,000.00	110,000.00

* ජල මනු අක්‍රීයව ඇති පාරිභෝගිකයින් සඳහා පෙර මාස 03ක අයකරන ලද ජල ගාස්තුවේ සාමාන්‍ය අගය අය කරනු ලැබේ.

* ජල මනු අක්‍රීය හෝ මනුවක් නොමැති අවස්ථාවක ගෘහ සම්බන්ධතාවයකින් රු. 250.00ක් ද,

* වෙළෙඳ හා රජයේ කාර්යාලවලින් රු. 500.00ක් ද,

* ජල සම්බන්ධතාවන් විසන්ධි කළ අවස්ථාවක දී නැවත ජලය ඉල්ලීමේ දී හිඟ ජල ගාස්තු හා රු. 1,000.00 දඩ මුදලක් අය කරනු ලැබේ.

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අයකිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.o යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 49, අංක 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 20/7 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කරන ලදුව (288 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ගෙවීම් ප්‍රමාණයන්	*ගාස්තු ප්‍රමාණය (පදිංචිය සඳහා)*	*ගාස්තු ප්‍රමාණය (වාණිජ හෝ වෙනත් භාවිත)*
	රු. ශත	*රු. ශත*
වර්ග අඩි 500ට නොවැඩි	500 0	1,000 0
වර්ග අඩි 501 සිට 750 දක්වා	750 0	1,500 0
වර්ග අඩි 751 සිට 1,000 දක්වා	1,000 0	2,000 0
වර්ග අඩි 1,001 සිට 1,250 දක්වා	1,250 0	2,500 0
වර්ග අඩි 1,251 සිට 1,500 දක්වා	1,500 0	3,000 0
වර්ග අඩි 1,501 සිට 2,000 දක්වා	2,000 0	3,500 0
වර්ග අඩි 2,001ට වැඩිවන සෑම වර්ග අඩි 100 හෝ ඉන් කොටසකට	250 0	500 0
පරීක්ෂණ ගාස්තු		
වීථි රේඛා/පිඹුරුපත්/ගොඩනැගිලි	1,000 0	1,000 0
වීථි රේඛා සහතිකය සඳහා	3,000 0	3,500 0

නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනුබෙදුම් කිරීම

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
මායිම්/තාප්ප/ ආරක්ෂක බැම්ම ඉදිකිරීම සඳහා	*නේවාසික (දික් මීටර 1 ක් සඳහා) :*	*වාණිජ හා වෙනත් (දික් මීටර 1 ක් සඳහා)*
ගොඩනැගිලි සීමාවෙන් පිටත	රු. 300.00	රු. 400.00
ගොඩනැගිලි සීමාවන් තුළ	රු. 500.00	රු. 600.00
ඉඩම් කුඹුරු ගොඩකිරීම	ව.මී. 150 ට අඩු රු. 1,500 ක් සහ එයට වැඩි සෑම ව.මී. 150කට රු. 1,000 බැගින්	

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
මායිම්/තාප්ප/ ආරක්ෂක බැම්ම ඉදිකිරීම සඳහා	*නේවාසික (දික් මීටර 1 ක් සඳහා) :*	*වාණිජ හා වෙනත් (දික් මීටර 1 ක් සඳහා)*
දුරකථන කුළුණු/ඇන්ටෙනා	උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ සෑම මීටර් එකකටම රු. 100 බැගින්	
විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත්කිරීම	රුපියල් මිලියන 50කට රු. 5,000 සහ වැඩිවන සෑම රුපියල් මිලියන 1 කට රු. 100 බැගින්	

නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම

පෙරසැරි ගාස්තු

ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර)	*රු. ශත*
45ට අඩු	5,00.00
45-90	1,000.00
91-180	1,250.00
181-270	1,500.00
271-450	1,750.00
451-675	2,000.00
676-900	2,250.00
901 ට වැඩි	2,250.00

වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින්

අනුකූලතා සහතික නිකුත්කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගත යුතුය)

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*		
ඉඩම් අනු බෙදුම්	පළමු බිම් කොටසකටම රු. 1,000 ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500 බැගින්		
නේවාසික ඉදිකිරීම්	ව.මී. 3,000 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්		
වාණිජ හා වෙනත් ඉදිකිරීම්	ව.මී. 3,000 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්		
මායිම් තාප්ප/ආරක්ෂක බැම්/ ඉදිකිරීම	පළමු දික් මීටර 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්		
ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම	ව.මී. 150ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්		
දුරකථන/විදුලි සංදේශ කුළුණු	උස මීටර 5 - 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර 1 කට රු. 100 බැගින්		
විශේෂ ව්‍යාපෘති	කුඩා පරිමාණ සඳහා	රු.	5,000.00
	මධ්‍යම පරිමාණ සඳහා	රු.	10,000.00
	මහා පරිමාණ සඳහා	රු.	20,000.00

අනු බෙදුම් අනුමත කිරීමේ ගාස්තු	*රු. ශත*
පර්චස් 20ට අඩු	750 0
පර්චස් 20-40 දක්වා	1,000 0
පර්චස් 40-80 දක්වා	1,250 0
පර්චස් 80-120 දක්වා	1,500 0
පර්චස් 120-160 දක්වා	1,750 0

වැඩි වන සෑම පර්චස් 80කටම රු. 150 බැගින් අය කෙරේ.

නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදි කිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*	
	නේවාසිකව (දික් මී. 1ක් සඳහා)	*වාණිජ හා වෙනත් (දික් මී. 1ක් සඳහා)*
ඉදිකිරීමේ අදියර		
අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇති විට	රු. 200	රු. 500
වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇති විට	රු. 300	රු. 1,000
වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	රු. 400	රු. 1,500
සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට	රු. 500	රු. 2,000
මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම	රු. 400	රු. 400
ඉඩම්/කුඹුරු ගොඩකිරීම දුරකථන/ විදුලි සංදේශ කුළුණු සඳහා	සෑම වර්ග මීටර් 150 කට රු 5,000 බැගින් උස සෑම මීටර් 5 කට රු. 10,000 බැගින්	
විශේෂ සංවර්ධන ව්‍යාපෘති	සෑම මිලියන 5 කටම රු. 10,000 බැගින්	
අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 50 බැගින්	

12 - 304/15

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කාර්යාලය සතු වාහන සහ යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීමේදී ගාස්තු අය කිරීම

ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක (01) viii.p යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. එස්. බුද්ධික සේනාරත්න,
සභාපති,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව,

2022 නොවැම්බර් මස 30 වැනි දින,
ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව සතු වාහන සහ යන්ත්‍රසූත්‍ර කුලියට ලබාදීමේ දී දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු තීරණවලට අනුව ගාස්තු අය කිරීමට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-304/16

හබරාදූව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පත්කළ දියුණු කළ ප්‍රදේශ තුළ පිහිටි එක් එක් දේපළ මත වරිපනම් නියම කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2022.10.18 වැනි දින තීරණ අංක 2022/108 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ වරිපනම් බදු පැනවීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

02. ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2023 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදළ වරිපනම් බදු මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලින් සියයට පහ (5%) ක වට්ටමක් ද, ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදළ කාලයට පෙර පැවති හිඟ වරිපනම් බදු වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමේ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, ගාලු දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපලවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල 2019 වර්ෂයේ තක්සේරු ප්‍රතිශෝධනය මත පදනම් වූ වාර්ෂික වටිනාකම්, 2023 වර්ෂය සඳහා එකී පනතේ 146(1) වැනි වගන්තියේ නියමය පරිදි සම්මත කිරීමටත්,

ඉහත කී 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, හා ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) ක වරිපනම් බද්දක් 2023 වර්ෂය සඳහා පැනවීමටත්; සහ

එකී වරිපනම්, එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන්වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට එකී 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තිය යටතේ විධානය කිරීමටත් එකී වාර්ෂික බද්ද ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවන විට දී බද්දේ ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද, කාර්තු ලෙස ගෙවන විට දී වාරිකය අයවිය යුතු කාලසීමාවේ පළමු මාසය ඇතුළත ගෙව්වහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් 5% වට්ටමක් ද ලබා දිය යුතු බවට එකී පනතේ 134 (7) වගන්තිය යටතේ විධානය කිරීමටත්, හබරාදූව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-230/1

හබරාදූව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් 2022.10.18 වැනි දින තීරණ අංක 2022/109 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ බද්ද නියම කිරීමේ කාර්යය සඳහා ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් නියමයන් සම්පූර්ණ කර ඇති බව වැඩිදුරටත් දන්වමි.

02. ඉහත කී වර්ෂයට අදාල සම්පූර්ණ අක්කර බදු මුදල 2023 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලින් සියයට දහය (10%) ක වට්ටමක් ද, කිසියම් කාර්තුවකට අදළ අක්කර බදු මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලින් සියයට පහ (5%) ක වට්ටමක් ද, ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදළ කාලයට පෙර පැවති හිඟ අක්කර බදු වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

දිල්ශාන් විදානගමගේ,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 22 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීමේ යෝජනාව

	විදුලිය සඳහා දිනකට (දින භාගයකට 50%)	1,000 0
	ජලය සඳහා දිනකට (දින භාගයකට 50%)	1,000 0
	ආරක්ෂිත ඇප මුදල (උපකරණ හා අනෙකුත් පහසුකම් නොමැතිව)	5,000 0
8.	ශබ්ද විකාශන පද්ධතිය සඳහා ගාස්තුව	2,500 0
9.	ප්ලාස්ටික් පුටුවක් ලබා දීම සඳහා ගාස්තුව	10 0
10.	වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව	250 0
11.	නොපවරා ගැනීමේ සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව	250 0
12.	ඔප්පු සාරාංශ උධෘත පෝරම (ඒ.ටී. පෝරම) ගාස්තුව	250 0
13.	අනතුරුදායක ගස් පෝරම ගාස්තුව	500 0
14.	ගොඩනැගිලි අයදුම්පත් පෝරම ගාස්තුව	500 0
15.	අතිරේක වරිපනම් තක්සේරු දැන්වීමක් නිකුත් කිරීමේ ගාස්තුව	150 0
16.	ටෙන්ඩර් පෝරම ගාස්තුව	500 0
17.	අයිතිය පිළිබඳ සහතික පෝරම ගාස්තුව	150 0

		ගාස්තුව (රු.)
18.	වරිපනම් උද්ධෘතයක් නිකුත් කිරීමේ පෝරම ගාස්තුව (එක් වර්ෂයක් සඳහා)	40 0
19.	ඉඩම් අනුබෙදුම් පෝරම ගාස්තුව	100 0
20.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තුව - වැඩිහිටි	100 0
21.	පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තුව - පාසල් ළමුන්	50 0
22.	වරිපනම් ලේඛනයට අළුතින් අංකයක් හා නව ගැණුම්කරුගේ නම ඇතුළත් කිරීමේ ගාස්තුව	200 0
23.	කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය බදුදීම දිනකට (පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා) වැඩිවන සෑම පැයකටම රු. 250 බැගින් (ඉන්ධන රහිතව හා ක්‍රියාකරු සහිතව)	2,500 0
24.	පුස්තකාල සාමාජිකයන් සඳහා ඒ 4 ප්‍රමාණයක කඩදාසියක තනිපැත්ත ඡායා පිටපතක් කිරීමට පුස්තකාල සාමාජිකයන් සඳහා ඒ 4 ප්‍රමාණයක කඩදාසියක දෙපැත්ත ඡායා පිටපතක් කිරීමට	2 0 3 0
25.	වෙනත් ඕනෑම සහතිකයක් නිකුත් කිරීම සඳහා ගාස්තු	150 0
26.	නිර්වන්දි ගිවිසුම් මුද්‍රිත ආකෘති පත්‍ර පිටපතක් නිකුත් කිරීමේ ගාස්තු	100 0
27.	පෞද්ගලික අංශයේ (හෝටල්, කර්මාන්තශාලා, වාණිජ ස්ථාන) කසළ ඉවත් කිරීම එක් ගමන් වාරයක් සඳහා ගාස්තු (සම්පූර්ණයෙන් පිරවූ ට්‍රැක්ටරයක් සඳහා) ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය (අදාළ උපකාර්යාල සේවා ලබා ගැනීමේ දී උප කාර්යාලයේ සිට කි.මී. 4 දුර සීමාව තුළ ප්‍රවාහන ගාස්තු අය නොකරන අතර ඊට වැඩිවන සෑම කි.මී. 1 ක් සඳහා ම ගමන් වාරයක මුදලට අමතරව රු. 50/- ක මුදලක් ප්‍රවාහන ගාස්තු ලෙස අයකරනු ලැබේ)	2,300 0
28.	ගලි සේවා ගාස්තුව - බල ප්‍රදේශය තුළ (එක් ගමන් වාරයක් සඳහා)	10,000 0
29.	ගලි සේවා ගාස්තුව - බල ප්‍රදේශයෙන් පිටත (එක් ගමන් වාරයක් සඳහා)	15,000 0
30.	ආදාහනාගාර ගාස්තුව - බල ප්‍රදේශය තුළ	6,000 0
31.	ආදාහනාගාර ගාස්තුව - බල ප්‍රදේශයෙන් පිටත	12,000 0
32.	ජල බවුසර සේවා ගාස්තු - බල ප්‍රදේශය තුළ පමණි (ජලය නොමැතිව)	5,000 0
33.	ගල්රෝල් මගින් සේවා ගාස්තු - පැය 08ක කාලයක් සඳහා රියැදුරු සහ ඉන්ධන සහිතව	15,000 0
34.	ඩම්ප් ට්‍රක්රථ සේවා ගාස්තු - පැය 08ක කාලයක් සඳහා රියැදුරු සහ ඉන්ධන සහිතව	20,000 0
35.	බැකෝ ලෝඩර් සේවා ගාස්තු - යාන්ත්‍රික පැය 01 සඳහා	4,500 0
36.	කොඩි කණුවක් කුලී පදනම මත ලබාදීම (දිනකට)	20 0

බලපිටිය ප්‍රාදේශීය සභාව

පාරිසරික බලපත්‍ර ගාස්තු අයකිරීම - 2023

බලපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්. සමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2022 වර්ෂයේ සැප්තැම්බර් මස 20 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 2264/18 දරන වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 27 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* "ඇ" කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත උපලේඛනයේ සඳහන් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුවක් සහ පරීක්ෂණ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා අය විය යුතු යැයි බලපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ව්‍යාපාර/කර්මාන්ත

මූලික ආයෝජනය	*පරීක්ෂණ ගාස්තු* *රු. ශත*
රු. 250,000 හෝ ඊට අඩු	3,000 0
රු. 250,000 - රු. 500,000	3,750 0
රු. 500,000 - රු. 1,000,000	5,000 0
රු. 1,000,000 ට වැඩි	10,000 0
වර්ෂ තුනකින් නිකුත් කරන පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව	4,500 0

පහත කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා ගත යුතුවේ :

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර/මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 100 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ හා සැකසුම් කිරීමේ කර්මාන්ත

13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්

    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව +[50x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව) + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින 'ප්ලාස්ටර් ඔෆ් පැරිස්' අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා
39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

මාතර ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි සියලුම නිවෙස්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2022 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කරන ලද 2015 වර්ෂයේදී කරනු ලැබූ වාර්ෂික වටිනාකම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට නවයක් (9%) ගෘහස්ථ දේපළ සඳහා ද එම ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව සියයට දෙළහක් (12%) ආදායමක් උපදවන සංවර්ධිත මට්ටමේ ගොඩනැගිලි සඳහා 2023 වර්ෂයේ පනවා අය කිරීමටත්, එම වරිපනම්, එකී ප්‍රාදේශීය සභ පනතේ 134(6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ 2023 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුලදී සමාන වාරික 04 කින් ගෙවීමට විධාන කිරීමටත්,

එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවේ පළමු මාසය තුලදී අදාල වරිපනම් බදු ගෙවන්නේ නම් එම කාර්තුවට අදාල මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද ලබා දීමටත්,

ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත ඉඩම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් ද අනෙකුත් දේපළ වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් 20% ක වරෙන්තු ගාස්තුවක් අය කිරීමට ද මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 05:05 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද නියමිත දිනට පෙර වරිපනම් මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී වරිපනම් මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මාතර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටි සියලුම නිවෙස්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2023 වර්ෂයේ පිළිගෙන ක්‍රියාත්මක කරන ලද 2015 වර්ෂයේදී කරනු ලැබූ වාර්ෂික වටිනාකම හා ඉන්පසුව පිළිගෙන කරන ලද සංශෝධන ද සමග 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

(ආ) එකී වාර්ෂික වටිනාකම මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ගෘහස්ථ දේපල සඳහා එකී දේපල මත ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට නවය (9%) ක්ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(2) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ආදායමක් උපදවන සංවර්ධිත මට්ටමේ ගොඩනැගිලි සඳහා සියයට දොළහක් (12%)ද 2023 වර්ෂයේ පනවා අය කළ යුතු බවටත්,

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථොක්ත වරිපනම් බද්ද 2023 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවන ලෙසට බද්දට යටත් වන සෑම තැනැත්තකුට ම නියම කිරීමටත්,

(ඉ) මෙම වාර්ෂිකව අයකරනු ලබන වරිපනම් බද්ද 2023 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම සම්පූර්ණයෙන් ගෙවන්නේ නම් බද්දේ ප්‍රමාණයෙන් 10%ක වට්ටම් මුදලක් ද, මුදල් කාර්තු වශයෙන් ගෙවන්නේ නම් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවන්නන් හට ගෙවන මුදලින් 5% ක වට්ටම් මුදලක් ද ලබා දීමටත් ඉහත සඳහන් පරිදි නියමිත දිනට පසුව ගෙවීම් කරන ගාස්තු මත හිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් 15%ක් ද, අනෙකුත් දේපළ වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදු ප්‍රමාණයෙන් 20% ක වරෙන්තු ගාස්තුවක් අය කිරීමටද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

(ඊ) තවද, නියමිත දිනට පෙර වරිපනම් මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී වරිපනම් මුදල් අයකර ගැනීමටද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 -282/ 1

මාතර ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ, 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2022 වර්ෂයේ දී බලාත්මක වූ සත්‍යෝක්ෂණය 2023 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමටත්, මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර පහක හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට සහ, 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, යථෝක්ත බද්ද, 2023 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් සෑම තැනැත්තෙකුට විධාන කළ යුතු යැයි ද, මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර මස 05 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 05:06 යටතේ ඒකමතිකව සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2023 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාල අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙන් අවසන් දිනයට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ලබාදෙන අතර නියමිත දිනට පෙර අක්කර බදු මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමකම 2022 වර්ෂයේදී බලාත්මක වූ සත්‍යෝක්ෂණය 2023 වර්ෂයේ සත්‍යෝක්ෂණය ලෙස පිළිගැනීමට ද,

(ආ) 134 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989-03-10 දිනැති *ගැසට් පත්‍රය* යටතේ IV(ආ) කොටස යටතේ අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්ය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයේ හෙක්ටයාර් 05ට අඩු නමුත් හෙක්ටයාර් 01 ට නොඅඩු ඉඩමක් සඳහා 2023 වර්ෂය සඳහා රු. 50.00 බැගින්ද, හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2023 වර්ෂය සඳහා රු. 10 0 බැගින් වන අනුප්‍රමාණ වාර්ෂික බද්දක් අයකළ යුතු යැයි ද,

(ඇ) 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත බද්ද 2023 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 30 යන දිනවලින් අවසන් වන කාර්තු 04 තුලදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙසද බද්දට යටත් වන සෑම තැනැත්තකුටම විධාන කළයුතු බවට මාතර ප්‍රදේශීය සභාව යෝජනා කරන්නීය.

(ඊ) තවද නියමිත දිනට පෙර අක්කර බදු මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තියේ විධිවිධාන අනුව දේපළ තහනමට ගෙන විකිණීමෙන් එකී අක්කර බදු මුදල් අය කර ගැනීමටද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 -282/2

මාතර ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බදු පැනවීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂය ඇතුළත යම් කර්මාන්තයක් පවත්වාගෙන යන සෑම තැනැත්තකු විසින් ම එකී පනතේ 150 වැනි වගන්තියේ (2) (1) උප වගන්ති අනුව දක්වා ඇති පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් කර්මාන්තයේ වාර්ෂික වටිනාකමට අනුරූපීව II වන තීරුවේ සඳහන් බදු මුදලක් පනවා අය කිරීමට මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 05:07 යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත වී ඇත.

ඒ අනුව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්තයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම එකී බදු මුදල 2023.06.30 වැනි දිනට පෙර මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය වෙත හෝ උප කාර්යාලයන් වෙත ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද නියමත දිනට පෙර බදු මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද වැඩිදුරටත් දැනුම් දෙනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2023 වර්ෂය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් වන සෑම තැනැත්තකු විසින්ම යටොක්ත බද්ද මාතර ප්‍රාදේශීය සභාව වෙත 2023.06.30 දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ද,

(ඇ) නියමිත දිනට බදු මුදල් ගෙවීම පැහැර හරින අයට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමටද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	කර්මාන්තය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
01.	සපත්තු නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
02.	ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
03.	ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම	000 0	750 0	1,000 0

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	කර්මාන්තය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත*
04.	සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
05.	තිරරෙදි මදුරුදැල් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
06.	පිඟන් බඩු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	හැලිවලං නිෂ්පාදනය	500 0	750 0	1,000 0
08.	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදනය	500 0	750 0	1,000 0
09.	සිමෙන්ති ගඩොල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
10.	විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ඩිජිටල් තාක්ෂණයේ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	බීරළු කැටයම් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	ගිනිකෙළි භාණ්ඩ නිෂ්පාදනය කිරීම සහ විකිණීම	500 0	750 0	1,000 0
18.	වායු සමීකරණ, ශීතකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ඉදල්, පාපිසි, කොසු ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම සහ විකිණීම	500 0	750 0	1,000 0
20.	මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21.	මැණික් කැපීම හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22.	සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23.	පොල්කටු අඟුරු නිෂ්පාදනය හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
24.	සත්ත්ව ආහාර නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
26.	විනාකිරි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ කල් තබා ගැනීම	500 0	750 0	1,000 0
28.	සම්පදම් කිරීම	500 0	750 0	1,000 0
29.	උම්බලකඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
30.	රබර් නිෂ්පාදනය හෝ රබර් රොටි තබා ගැනීම	500 0	750 0	1,000 0
31.	කරවල ලුණු මාළු හෝ ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
	කර්මාන්තය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
32.	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
33.	පුන්නක්කු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
34.	වේවැල් භාණ්ඩ නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
35.	වඩු කර්මාන්ත වැඩපළක් පවත්වා ගැනීම	500 0	750 0	1,000 0
36.	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
37.	රසකැවිලි නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
38.	පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
39.	පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
40.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
41.	කෝපි, ධාන්‍ය වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ටයර් හා ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
44	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
45.	උළු නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
46.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
47.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
48.	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
49.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
50.	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
51.	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
52.	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
53.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
54.	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
55.	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
56.	අයිස්ක්‍රීම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
57.	මිරිස්, තුනපහ ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
58.	පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
59.	නරක්වනසුළු ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (එළවළු හා හොටෙල් බලපත්‍ර යටතට ගැනෙන ආහාර ද්‍රව්‍ය සිල්ලර වශයෙන්)	500 0	750 0	1,000 0
60.	නූඩ්ල්ස් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
	කර්මාන්තය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
61.	පළතුරු, බීම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	කෑම පාර්සල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
63.	සකස් කළ කෙටි ආහාර හා සිසිල් බීම (ස්නැක් බාර්) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
64.	පැකට් කළ බීම වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
65.	යන්ත්‍රානුසාරයෙන් ගල් කැඩීම	500 0	750 0	1,000 0
66.	මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ගරාජයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
67.	කිසියම් වර්ගයක යන්ත්‍ර පාවිච්චියට ගනු ලබන ලී ඉරන මෝලක් තිබීම	500 0	750 0	1,000 0
68.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	වී මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
70.	විදුලි කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
71.	යන්ත්‍ර මගින් පොල් තෙල් සෑදීම	500 0	750 0	1,000 0
72.	සුරුට්ටු, බීඩි සෑදීම	500 0	750 0	1,000 0
73.	රෙදි ඩයි දැමීම හෝ ඩ්‍රයික්ලීන් හෝ රෙදි මැදීමේ ආයතනයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
74.	කබොක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමේ ගල් වලවල් හැරීම	500 0	750 0	1,000 0
75.	රබර් නිෂ්පාදනය හා රබර් රොටි සෑදීම	500 0	750 0	1,000 0
76.	ලෝහ ආශ්‍රිත නිෂ්පාදන වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
77.	යකඩ හා වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
78.	ත්‍රි රෝද රථ,යතුරු පැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	එළවළු, සිල්ලර බඩු, සාප්පු බඩු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
80.	කළුගල් කැණීම හෝ කැපීම (කැටයම් කැපීම)	500 0	750 0	1,000 0
81.	පොල් තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
82.	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
83.	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
84.	පාපැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
85.	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
86.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
	කර්මාන්තය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
87.	මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
88.	කොහු හෝ වෙනත් කෙදි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
89.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
90.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
91.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
92.	යන්ත්‍ර මාර්ගයෙක් කෙදිවර්ග හෝ කොහු ලණු නිපදවීම	500 0	750 0	1,000 0
93.	ඉලෙක්ට්‍රොනික් පේන්ට් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
94.	ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
95.	රෙදි මුද්‍රණය හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
96.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
97.	තෙල් හා සත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
98.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
99.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
100.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
101.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
102.	කෘමිනාශක, දිලීරනාශක, පැළැටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
103.	විෂබීජනාශක නිපදවීම	500 0	750 0	1,000 0
104.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනාසාල් හෝ කෙදි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
105.	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
106.	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
107.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
108.	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0
109.	බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
110.	ඉදිකිරීමේ යන්ත්‍ර උපකරණ බදුදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
111.	ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
112.	පළතුරු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
113.	ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
114.	පාවහන් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
115.	කොප්පරා මැස්සක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව	II වැනි තීරුව		
	කර්මාන්තය	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශත	ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,501 ට වැඩි රු. ශත
116.	පැකට් කරන ලද ආහාර (බිස්කට්/ ටොපි) විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
117.	සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
118.	ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
119.	භෝග පැළ සකස් කිරීමේ සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
120.	බැටරි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
121.	පොලිතීන් ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
122.	පරිගණක උපාංග විකිණීමේ හා අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
123.	හඳුන්කුරු නිෂ්පාදනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
124.	ළඳරු උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
125.	පානීය ජලය බෝතල්ගත කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
126.	එළවළු, පළතුරු වියලීම හා ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
127.	රෙදි සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
128.	මුද්‍රණ සැකසුම් හා ඡායා පිටපත් ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
129.	ගීත පටිගත කිරීමේ හා වීඩියෝ කැසට් විකිණීම හෝ බදු දීම	500 0	750 0	1,000 0
130.	විකිණීම සඳහා විසිතුරු මසුන් ඇති කිරීම	500 0	750 0	1,000 0
131.	තේකොළ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
132.	ධාන්‍ය වර්ග ඇඹරීමේ, පැකට් කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
133.	තේ පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
134.	කිරි පැණි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
135.	බිම්මල් (හතු) නිෂ්පාදනය	500 0	750 0	1,000 0
136.	පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි තබා ගැනීම	500 0	750 0	1,000 0
137.	පින්තූර රාමු කිරීම හා වීදුරු රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

මාතර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇති 2008.12.05 දිනැති අංක 1579 දරන *ගැසට් පත්‍රය* මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතර, සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව බලපත්‍රයක් ලබා ගත යුතු පහත උපලේඛන 01 හි I වැනි තීරයේ යම් පරිශ්‍රයක්, ස්ථානයක් සම්බන්ධයෙන් II වැනි තීරයේ සඳහන් අනුප්‍රමාණයෙන් යුත් බලපත්‍ර ගාස්තුවක් පනවන ලද සෑම ව්‍යාපාරයක් මතම 2023 වර්ෂයට පනවා අය කිරීමටත්, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පොළක් සඳහා ඊට අදාල බලපත්‍ර ලබා දීමේ දී අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2023 වර්ෂයට පනවා අය කිරීමටත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2023.03.31 වැනි දිනට පෙර අදාල ස්ථානයන් පවත්වාගෙන යනු ලබන තැනැත්තන විසින් ලබා ගත යුතු බවත් මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 05:08 යටතේ සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද එම බලපත්‍ර ගාස්තුව එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවා අදාල බලපත්‍ර ලබාගත යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

තවද නියමිත දිනට ඉහත කී බලපත්‍රය ලබා නොගත් සෑම ව්‍යාපාරයක් හෝ ස්ථානයක්ම 1988.08.23 වන දින අංක 520/7 දරන සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ව්‍යාපාරය වසා දැමීම දක්වා කටයුතු කිරීමට සිදුවන බවද තවදුරටත් දැනුම් දෙනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇති 2008.12.05 දිනැති අංක 1579 දරන *ගැසට් පත්‍රය* මගින් මාතර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මාතර ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2023 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂයට පනවා අය කිරීමටත්,

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත අනුව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටලයක්. ආපනශාලාවක්, නවාතැන්පොළක් සඳහා ඊට අදාල බලපත්‍ර ලබා දීමේ දී අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2023 වර්ෂයට පනවා අය කිරීමටත්, ඉහත සඳහන් සියලුම බලපත්‍ර 2023.03.31 වැනි දිනට පෙර අදාල ස්ථානයන් පවත්වාගෙන යනු ලබන තනැත්තන් විසින් ලබා ගත යුතු බවත් මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව*	*II වැනි තීරුව*		
	කර්මාන්තය	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට අඩු රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 සිට රු. 1,500 දක්වා රු. ශත*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 1,500 ට වැඩි රු. ශත*
01.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	කොණ්ඩ කැපීමේ ස්ථාන/බාබර් සාප්පු හා සැලුන් හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම (කිරි ආහාර වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම)	500 0	750 0	1,000 0
07.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	බත්කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	නවතැන් පළවල්, ලැගුම්හල් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	සංචාරක වෙළඳාම	500 0	750 0	1,000 0
13.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0

12 -282/4

මාතර ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බදු පැනවීම - 2023 වර්ෂය
නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ 147 වැනි වගන්තිය හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හා එම පනතේ 150 (1) වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් වෙළඳ ව්‍යාපාරයක් මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මත මෙහි පහත උපලේඛන I හි I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ උපලේඛන II හි සඳහන් පරිදි ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ ජුනි මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05:09 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද නියමිත දිනට පෙර බදු මුදල් නොගෙවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ 147 වැනි වගන්තිය හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ හෝ එම පනතේ 150 (1) වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේ පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් විෂය අංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයක වාර්ෂික බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට ද,

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තකු විසින් යථෝක්ත බද්ද 2023 ජූනි මස 30 වැනි දිනට ප්‍රථම මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතු බවටද,

(ඇ) නියමිත දිනට බදු මුදල් ගෙවීම පැහැර හරින අයට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 (4) වගන්තිය ප්‍රකාරව අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමටද මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය (I කොටස)

I වැනි තීරුව *2022 වර්ෂයේ දී ආදායම*	*II වැනි තීරුව* *රු. ශ.*
රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 150,000 ඉක්මවන විට	3,000 0

උපලේඛනය (II කොටස)

01. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
02. ටයර් හා ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
03. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
04. ඇන්ටනා නිෂ්පාදනය
05. උත්සව භාණ්ඩ කුලියට දෙන ස්ථානයක් පවත්වාගෙන යාම
06. යකඩ බඩු වෙළඳ සලක් පවත්වාගෙන යාම
07. රථ වාහන අමතර කොටස් වෙළෙඳ සලක් පවත්වාගෙන යාම
08. ගෘහ භාණ්ඩ වෙළෙඳ සලක් පවත්වාගෙන යාම
09. සපත්තු සාප්පුවක් පවත්වාගෙන යාම
10. පොත් සාප්පුවක් පවත්වාගෙන යාම
11. කැසට් හා ගුවන් විදුලි යන්ත්‍ර, ඔරලෝසු, රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක්

12. මෝටර් බයිසිකල් වෙළඳ සලක්
13. පාපැදි විකුණන ස්ථානයක්
14. මෙරට හා රටබීම වෙළෙඳ සලක්
15. විදුලි උපකරණ වෙළෙඳ සලක්
16. පිඟන් බඩු වෙළෙඳ සලක් පවත්වාගෙන යාම
17. ශබ්ද විකාශන යන්ත්‍ර බදු දෙන ස්ථානයක්
18. ඉංග්‍රීසි බෙහෙත් වර්ග විකුණන ස්ථානයක්
19. පැරණි ලෝහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක්
20. නිමි ඇඳුම් වෙළෙඳ සලක් පවත්වාගෙන යාම
21. සාප්පු බඩු (කිරිපිටි, ප්ලාස්ටික්, ලිපිද්‍රව්‍ය පාසල් උපකරණ)
22. ප්ලාස්ටික් බඩු / ඇලුමිනියම් බඩු ගබඩා කිරීම හා විකිණීම
23. ප්ලාස්ටික් (ෆයිබර් ග්ලාස්/ලෝහ ආශ්‍රයෙන් පුවරු නිෂ්පාදනය)
24. උත්සව සඳහා ආහාර පාන සැකසීම හා උත්සව සඳහා ස්ථාන බදු දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
26. කෑමට ගන්නා ලුණු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
27. මිනී පෙට්ටි සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
28. දියහුණු හෝ හුණු වැරටි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
29. බ්‍රේක් ලයිනර් නිෂ්පාදනය කිරීමේ, පාවිච්චි කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. රථ වාහන එලයිමන්ට් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. යකඩ හා වානේ ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. රථවාහන ආදියේ විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක්
33. මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
34. මල් පෝච්චි නිෂ්පාදනය කිරීම හා විකිණීම
35. නෙස්කැෆේ මැෂින් යන්ත්‍ර බදුදීම
36. රියැදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
37. උපදේශන සහ විදේශීය සංචාර සංවිධානයක් පවත්වාගෙන යාම
38. කුලී පදනම මත වාහන ලබාදීමේ ස්ථානයක්
39. ගුවන් ටිකට් පත් අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක්
40. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
41. බතික් කර්මාන්තයක් පවත්වාගෙන යාම
42. පෙර පාසැලක්, දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
43. බැංකුවක් පවත්වාගෙන යාම
44. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
45. ලයිට් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
46. ගෘහ නිර්මාණ හා වාස්තු විද්‍යා සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
47. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
48. ඇස් කණ්නාඩි සාප්පුවක් පවත්වාගෙන යාම
49. පශු වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
50. නරක්වනසුළු කෑම වර්ග ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීම සඳහා
51. අලුත් ලෝහ හෝ පරණ ලෝහ එක්රැස් කිරීම හා විකිණීම
52. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
53. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
54. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
55. පාවිච්චිකළ ඇඳුම් ගබඩා කිරීම හා විකිණීම
56. කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක්
57. සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

58. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
59. තීන්ත අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක්
60. පෞද්ගලික අධ්‍යාපන ආයතනක් පවත්වාගෙන යාම
61. විගණනයෙන් විගණකාධිකාරි සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
62. ලොතරැයි නියෝජිත ආයතනයක්
63. රේස් බුකියක් පවත්වාගෙන යාම
64. නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
65. රබර්, කුරුඳු මිලට ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
66. රැකියා නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
67. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
68. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. වැහිපීලි, අමානෝ තහඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
70. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. දේපළ තක්සේරුකරණය හා ව්‍යාපාර උපදේශන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
72. කෘෂි උපකරණ නිෂ්පාදනය හා විකිණීම
73. වාහන ප්‍රින්ටඩ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
74. කබොක් ගල්, බොරළු හෝ කළුගල් ලබා ගැනීමේ ගල්වලක් පවත්වාගෙන යාම
75. කළුගල් කැණීමේ හෝ කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
76. දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
77. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
78. අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම
79. සූර්ය පැනල සවිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. ලිහිසිතෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
81. පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම
82. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
83. අවමංගල සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
84. ඉදිකිරීම් ද්‍රව්‍ය හලක් පවත්වාගෙන යාම
85. ඉඩම් හා දේපල විකිණීමේ බ්‍රෝකර්වරයෙකු වශයෙන් කටයුතු කිරීම
86. අලුත්වැඩියා කර සකසන ලද වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

12 -282/5

මාතර ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති සීමාව ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක -

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට වෙන්කර නොමැති විටක හෝ
(ඇ) ඒ ඉඩමෙහි ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම් එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% බද්දක් පැනවීමටත්, මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 05 වැනි දින, පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේදී තීරණ අංක 05:10 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද මෙම බද්ද 2023 ජූනි මස 30 වැනි දිනට පෙර මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මාතර ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ නිත්‍ය හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට වෙන්කර නොමැති විටක හෝ
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය හෝ වගා කිරීමට යටත් බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 60% ට වඩා අඩු වන්නේ නම්

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ ජූනි මස 30 වැනි දිනට පෙර මාතර ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබිය යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12 -282/6

මාතර ප්‍රාදේශීය සභාව

සභාව සතු භූමි මත තාවකාලික බදු පැනවීම - 2023 වර්ෂය

මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විශේෂ අවස්ථා සඳහා ඉදිකරනු ලැබූ තාවකාලික වෙළඳසල් වෙතොත් 2023 වර්ෂය සඳහා දිනකට පහත උපලේඛනයේ දැක්වෙන පරිදි දෛනික ගාස්තුවක් පනවා අය කිරීමට 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05:11 යටතේ යෝජනාවක් ඒකමතිකව සභා සම්මත වී ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව එවැනි ඉදිකිරීමක් කළ සෑම තැනැත්තෙකු විසින්ම පහත උපලේඛනයේ දැක්වෙන එකී බදු මුදල වෙළඳ ස්ථානය ඉදිකිරීමට පූර්වයෙන් හෝ වෙළඳ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම අදාළ ගාස්තු ගෙවා සභාවේ අවසර පත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු බව තවදුරටත් දැනුම් දෙනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විශේෂ අවස්ථා සඳහා ඉදිකරන ලද තාවකාලික වෙළඳසල්වලින් දිනකට පහත උපලේඛනය පරිදි බදු මුදලක් 2023 වර්ෂය සඳහා අය කිරීමට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01.	වර්ග අඩි 01 සිට 05 දක්වා	5 00
02.	වර්ග අඩි 06 සිට වැඩිවන සෑම වර්ග අඩියක් දක්වාම	7 00
03.	ජංගම වෙළඳ ව්‍යාපාර සඳහා	25 00
04.	ජංගම වෙළඳ වාහන (නැවතුම් රථ)	20 00
05.	ත්‍රීවිල් රථයක් සඳහා	10 00

12 -282/7

මාතර ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ආදාහනාගාර ගාස්තු අයකිරීම

මාතර ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 05:012 යටතේ පහත දැක්වෙන යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

2023 වර්ෂය සඳහා පහත උපලේඛනයේ සඳහන් පරිදි ආදාහනාගාර ගාස්තු අයකළ යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය,

උපලේඛනය

		රු. ශත
01.	මාතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආදාහනයක් සඳහා	8,000 0
02.	බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් සඳහා	10,000 0
03.	අළු තැන්පත් කිරීම සඳහා (2' x 2')	5,000 0
04.	සාමාන්‍ය මිහිදන් කිරීම සඳහා	1,000 0
05.	වල නොබැඳ අළු බැහැරකිරීම සඳහා	1,000 0

12 -282/8

මාතර ප්‍රාදේශීය සභාව

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (1) වැනි වගන්තිය ප්‍රකාරව මාතර ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයට සේවා සැපයීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2023.01.01 වැනි දින සිට පනවා අය කිරීමට 2022 ඔක්තෝබර් මස 05 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05:13 යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 වර්ෂය සඳහා මාතර ප්‍රාදේශීය සභාවට පහත සඳහන් සේවාවන් සඳහා ගාස්තුවක් ගෙවිය යුතු බවට මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

		රු. ශත
01.	ගොඩනැගිලි අයදුම් පත්‍ර	600 0
02.	ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍ර ගාස්තු	300 0
03.	වරිපනම් ඔප්පු සාරාංශ	400 0
04.	වරිපනම් නාම සංශෝධනය	150 0
05.	වරිපනම් බදු සඳහා සහතික නිකුත් කිරීම	250 0
06.	වරිපනම් ලේඛන වල උධෘත ලබා දීමේදී එක් වරිපනම් අංකයක් සඳහා	300 0
07.	ඵලදෘ බදු ටෙන්ඩර් පෝරම ගාස්තු	50 0
08.	ඵලදෘ බදු ටෙන්ඩර් තැන්පතු ගාස්තු	100 0
09.	වෙන්දේසි බලපත්‍ර ගාස්තු	1,000 0
10.	වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	500.00 මාසයක් ඇතුළත නිකුත් කිරීම 25% මාස 02 ක් ඇතුළත 50%/මාස 03 පසු සම්පූර්ණ ගාස්තු
11.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු	4,000 0 + රජයේ බදු
12.	ප්‍රාදේශීය සභාව සතු බිම් බදු දීම, වෙළෙඳ කාර්යක් සඳහා වර්ග අඩි 01 ක් සඳහා	5 0
13.	අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු	
	• කොස්ගස් 01 ක් සඳහා	1,500 0
	• වෙනත් ඕනෑම ගසක් සඳහා	1,000 0
14.	ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේදී වර්ග මීටර් 01 ක් සඳහා	
	• කොන්ක්‍රීට් පාරක් සඳහා	4,000 0
	• තාර පාරක් සඳහා	4,000 0
	• කාපට් පාරක් සඳහා	13,500 0
	• කුට්ටිගල් පාරක් සඳහා	4,000 0
15.	පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීමේ ගාස්තු (වැඩිහිටි)	100 0
16.	පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීමේ ගාස්තු (ළමා)	50 0
17.	පුස්තකාල දඩ දිනකට	2 0
18.	බැකෝ රථය කුලියට දීම (පැයකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක.)	5,000 0
19.	මාර්ග තලනය කුළියට දීම	
	• සභා බල ප්‍රදේශය තුළ (දිනකට)	8,000 0
	• සභා බල ප්‍රදේශයෙන් පිටත (දිනකට)	8,500 0

		රු. ශත
20.	ට්‍රැක්ටර් රථ කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක)	12,000 0
21.	ට්‍රක් ජල බවුසරය කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක)	14,000 0
22.	ට්‍රැක්ටර් ජල බවුසරය කුළියට දීම (දිනකට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක) සහා බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන සෑම කි.මී. සඳහාම)	8,600 0 35 0
23.	ටිපර් රථය කුලියට දීම (දිනට) (දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් මත වෙනස් විය හැක.)	20,000 0
24.	කර්මාන්ත ගිවිසුම් පිටපතක්	200 0
25.	ජල සහතික ගාස්තු (අනුමත ගොඩනැගිලි)	110 0
26.	ජල සහතික ගාස්තු (අනුමත නොවූ ගොඩනැගිලි)	260 0
27.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) අයදුම්පත්‍ර ගාස්තුව	25 0
28.	ගොඩනැගිලි බලපත්‍රය වසරකින් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව	300 0
29.	ලේඛනාගාරයෙන් ගොනු පිටපත් සෙවීමේ ගාස්තු එක් අයිතමයක් සඳහා	150 0
30.	ප්‍රාදේශීය සභා සංස්ථාපනය කිරීමට පෙර ඉදිකිරීමක් බවට ලිපියක් ලබාදීම	210 0
31.	වෙළඳ ප්‍රකාරක වැඩසටහන් සඳහා බලපත්‍ර ගාස්තු (දිනකට)	1,000 0

12 -282/9

මාතර ප්‍රාදේශීය සභාව

ගාස්තු අය කිරීම - 2023 වර්ෂය

1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023 වර්ෂයට පනවා අයකළ යුතු යැයි 2022 ඔක්තෝබර් මස 05 වැනි දින තීරණ අංක 5:14 යටතේ සභාව විසින් ඒකමතිකව සහා සම්මත කළ බවත්, මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. කේ. විමල් ප්‍රියජනක,
සභාපති,
මාතර ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

යෝජනාව

1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර ගාස්තුව හා ප්‍රාදේශීය සභා පනතේ 49(7) වගන්තිය ප්‍රකාරව නොපවරා ගැනීමේ පරීක්ෂණ ගාස්තු ද නිවාස හා නගර සංවර්ධන ආඥාපනතට අනුව හා ගෘහ හා නගර නිර්මාණ ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2023 වර්ෂයට පනවා අයකළ යුතු යැයි මාතර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*භාවිතා කළයුතු ආකෘති පත්‍රය*	*අයකළ යුතු ගාස්තු*	
(i.) සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම	"අ"	පෙරසැරි ගාස්තු :	
(ii.) ඉඩම් අනු කොටස්වලට බෙදීම		i. බිම් කට්ටිය ප්‍රමාණය	එක් එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර)
		* ව.මී. 150 - 300 අතර	රු. 500 00
		* ව.මී. 301 - 600 අතර	රු. 400 00
		* ව.මී. 601 - 900 අතර	රු. 300 00
		* ව.මී. 900 ට වැඩි	රු. 200 00

(iii.) ගොඩනැගිලි ඉදිකිරීම / පවත්නා ගොඩනැගිලිවලට අලුතින් කොටසක් එකතු කිරීම / නැවත ඉදිකිරීම	"ආ"	ii. ගෙබිමේ විශාලත්වය	පදිංචිය සඳහා	වාණිජ හෝ වෙනත් භාවිත
			රු. ශත	රු. ශත
		45 ට අඩු	500 0	1,000 0
		45-90	1,500 0	2,000 0
		91-180	2,500 0	3,000 0
		181-270	3,500 0	4,000 0
		271-450	4,500 0	6,000 0
		451-675	5,500 0	8,000 0
		676-900	6,500 0	10,000 0
		901-1225	7,500 0	12,000 0
		1225 ට වැඩි	7,500 0	12,000 0
			ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,000 බැගින්	ව.මී. 1126 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු. 1,250 බැගින්

(iv.) මායිම් තාප්ප / ආරක්ෂක බැමි ඉදිකිරීම	iii. නේවාසික දික් මීටර් 1 ක් සඳහා ගාස්තුව	වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1 ක් සඳහා
• ගොඩනැගිලි සීමාවෙන් පිටත	රු. 300 0	රු. 400 0
• ගොඩනැගිලි සීමාව තුළ	රු. 500 0	රු. 600 0
(v.) ඉඩම් / කුඹුරු ගොඩකිරීම	iv. ව.මී. 150 ට අඩු රු. 1,500. 00 ක් සහ එයට වැඩි සෑම ව.මී. 150 කට රු. 1,000 0 බැගින්	
(vi.) දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණ ඉදි කිරීම	v. උස මීටර් 5-20 දක්වා රු. 20,000 0 ක් සහ වැඩි වන සෑම මීටර් එකකටම රු. 100 0 බැගින්	
(vi.) විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම	vi. රුපියල් මිලියන 5 කට රු. 5,000 සහ වැඩි වන සෑම රුපියල් මිලියන එකකට රු. 100 බැගින්	

		පෙරසැරි ගාස්තු :	
		i. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	රු. ශත
		45 ට අඩු	500 0
		45-90	1,000 0
		91-180	1,250 0
		181-270	1,500 0
		271-450	1,750 0
		451-675	2,000 0
		676-900	2,250 0
		900 ට වැඩි	වර්ග මීටර් 901 ට වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 500 බැගින්
3. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය	"ඇ"		
		පෙරසැරි ගාස්තු :	
(i.) ඉඩම් අනුබෙදුම් සඳහා		i. වර්ග මීටර් 1000 ට අඩු ඉඩම් සඳහා	රු. 2,000
		වර්ග මීටර් 1001-5000 දක්වා	රු. 5,000
		වර්ග මීටර් 5001-10000 දක්වා	රු. 10,000
		10000 සිට වැඩි වන සෑම වර්ග මීටර් 1000 කටම රු. 1,000 බැගින්	
(ii.) ගොඩනැගිලි ඉදිකිරීම / අලුතින් එකතු කිරීම / නැවත ඉදිකිරීම	i	නේවාසික	වාණිජ හා වෙනත්
	ii	රු. 2,000	රු. 5,000
(iii.) මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම		රු. 1,500	රු. 3,000
		ව.මී. 150 ට අඩු ඉඩම් සඳහා	රු. 2,500
		ව.මී. 151 සිට 300 දක්වා	රු. 5,000
		ව.මී. 301 ට වැඩිවන සෑම ව.මී. 150 කටම	රු. 3,000 බැගින්
(iv.) ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා		උස මීටර් 5-20 දක්වා	රු. 20,000
		උස මීටර් 20 ට වැඩි සෑම මීටර් 01 ක් සඳහාම රු. 100 බැගින්	
(v.) දුරකතන/විදුලි සංදේශ කුළුණු			
(vi.) විශේෂ සංවර්ධන ව්‍යාපෘති		කුඩා පරිමාන රු. මිලියන	
		5 ට අඩු වන ව්‍යාපෘති	රු. 10,000
		මධ්‍යම පරිමාන රු. මිලියන	
		5-50 අතර ව්‍යාපෘති	රු. 50,000
		මහා පරිමාන රුපියල් මිලියන	
		50 ට වැඩි ව්‍යාපෘති	රු. 150,000
4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් / සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගත යුතුය)		අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු	
(i.) ඉඩම් අනුබෙදුම්		i. පළමු බිම් කොටසකට රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 500 බැගින්	

(ii.) නේවාසික ඉදිකිරීම්	ii. ව.මී. 300 ට අඩු රු. 3,000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 10 බැගින්	
වාණිජ හා වෙනත් ඉදිකිරීම්	ව.මී. 100 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කටම රු. 20 බැගින්	
(iii.) මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	iii. පළමු දික් මීටර 100 සඳහා රු. 1,000 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 10 බැගින්	
(iv.) ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩකිරීම	iv. ව.මී. 150 ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට රු. 20 බැගින්	
(v.) දුරකථන/ විදුලි සංදේශ කුළුණු	v. උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට රු. 100 බැගින්	
(vi.) විශේෂ ව්‍යාපෘති	vi. කුඩා පරිමාණ සඳහා	රු. 5,000
	මධ්‍යම පරිමාණ සඳහා	රු. 10,000
	මහා පරිමාණ සඳහා	රු. 20,000
5. මෝටර් රථ වාහන නවතා තැබීමේ ස්ථාන (නා.සං.අධිකාරි නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියමකර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු)		
	සැහැල්ලු වාහන හා කාර්	රු. 500,000
	ලොරි	රු. 1,000,000
49. විසිතුරු භාණ්ඩ හා අත්කම් භාණ්ඩ නිෂ්පාදනය
50. විදුලි උපකරණ නිපැයුම
51. වීදුරු භාණ්ඩ නිපැයුම
52. මැණික්, දියමන්ති ඔප දැමීමේ කර්මාන්තය
53. ලේස් නිෂ්පාදනය
54. නූල් නිපැයුම
55. දුනු නිපැයුම
56. කෘතිම මල් නිපැයුම
57. පොලිතින් නිපැයුම
58. අත් වැසුම් නිපැයුම
59. පිඟන් මැටි උපයෝගී කරගෙන භාණ්ඩ නිපැයුම
60. අශ්ව රේස් ඔට්ටු ඇල්ලීමේ ස්ථානයක්
61. මෝටර් රථ වෙළෙඳාම

62. ජාත්‍යන්තර පාසල් පැවැත්වීම
63. රා තැබෑරුමක් පැවැත්වීම (රජයේ අනුමැතිය ලත්)
64. සිමෙන්තිවලින් ගල්, උළුවහු, කොන්ක්‍රීට් කණු නිෂ්පාදනය කරන ස්ථානයක් පැවැත්වීම
65. දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
66. ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පැවැත්වීම
67. ස්වර්ණාභරන වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
68. ලොතරැයි ටිකට්පත් අලෙවි නියෝජිත කාර්යාලයක් පවත්වාගෙන යාම
69. ළදරු පෙර පාසලක් පැවැත්වීම
70. කාර්යාලයක් පැවැත්වීම
71. පුද්ගලික දේපළ වෙළඳ සමාගමක් පැවැත්වීම
72. පුද්ගලික පන්ති පවත්වන්නන්
73. සිනමා ශාලාවක් පැවැත්වීම
74. ලැගුම්හලක් පවත්වා ගෙන යාම
75. රථගාලක් පවත්වාගෙන යාම
76. කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
77. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
78. මෝටර් සයිකල් සඳහා ආරක්ෂිත ස්ථානයක් පවත්වාගෙන යාම
79. කන්ටේනර් අංගනයක් පැවැත්වීම
80. කළුගල්, වැලි, සිමෙන්ති, ගඩොල් ගබඩාකර, අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම
81. මේස් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
82. ගොඩනැගිලි නිර්මාණ කටයුතු කිරීමේ කාර්යාලයක් පවත්වාගෙන යාම

මෙම ව්‍යාපාර බද්ද 2023 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතුය.

12 -240/4

ජා - ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට ඉඩම් විකිණීම මත බදු අයකිරීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර යටතේ ජා - ඇල ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජකයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට (1%) කට සමාන බද්දක් විකුණුම්කරුගෙන් හෝ තැරැව්කරුගෙන් හෝ වෙන්දේසිකරුගෙන් හෝ ඔහුගේ සේවකයාගෙන් හෝ අනුනියෝජිතයාගෙන් හෝ ජා-ඇල ප්‍රාදේශීය සභාවට අයකර ගත යුතු බවට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා - ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

12 - 240/5

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම ගාස්තුව	25 0
සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා -	
(අ) වෙළෙඳ කාර්යය සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ වෙළඳ කාර්යය යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 240/6

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ විධිවිධාන අනුව ජා-ඇල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීම් හෝ ස්ථාවර නැනහොන් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

I. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ

II. ඒ ඉඩමේ විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක; හෝ

III. ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 5:1ට වඩා, අඩු වන්නේ නම්.

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට බිංදුවයි දශම පහක (0.5%) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ජා-ඇල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

12-240/7

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති 2008.07.30 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍ර* අංක 1560/6 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* 2008 අංක 01 දරන බස්නාහිර පළාතේ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති 01 පරිච්ඡේදයේ සිට 07 වන පරිච්ඡේදය දක්වා එහි 01 උපලේඛනයේ සිට 09 වන උපලේඛනය දක්වා වූ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ රීති අනුව ජා-ඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉවත් කරනු ලබන කසළ වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ආකාරයට ගාස්තු අයවිය යුතු බවත් මෙම ගාස්තු අය කිරීම 2023 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

අංකය	*වර්ගය*	*අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය*	*දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය (Kg)*	*අදාළ ගාස්තුව රු.*
01	හෝටල් (දේශීය සහ විදේශීය)	මහා පරිමාණ	>50	22,500 - 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000 - 22,500
		කුඩා පරිමාණ	<10	1,000 - 5,000

අංකය	*වර්ගය*	*අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය*	*දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය (Kg)*	*අදාළ ගාස්තුව රු.*
02	නේවාසිකාගාර/හෝටල්	මහා පරිමාණ	>10	5,000 - 25,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500 - 5,000
		කුඩා පරිමාණ	<5	500 - 2,500
03	අවන්හල්/ආහාර ලබාගනු ලබන ස්ථාන/ උත්සව ශාලා	මහාපරිමාණ	>50	5,000 - 25,000
		මධ්‍ය පරිමාණ	10-50	2,500 - 5,000
		කුඩා පරිමාණ	<10	500 - 5,000
04	සුපිරි වෙළඳසල්	මහා පරිමාණ	>50	22,500 - 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000 - 22,500
		කුඩා පරිමාණ	<10	5,000 - 2,500
05	එළවළු/පළතුරු/මාළු/මස් වෙළඳ සල්	මහා පරිමාණ	>10	22,500 - 50,000
		මධ්‍ය පරිමාණ	5-10	5,000 - 22,500
		කුඩා පරිමාණ	<5	1,000 - 5,000
06	කර්මාන්ත ශාලා (උපද්‍රවකාරී නොවන)	මහා පරිමාණ	>50	22,500 - 50,000
		මධ්‍ය පරිමාණ	10-50	5,000 - 22,500
		කුඩා පරිමාණ	<10	1,000 - 5,000
07	පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ බෙහෙත් ශාලා (ආසාදිත නොවන)	මහා පරිමාණ	>30	20,000 - 50,000
		මධ්‍ය පරිමාණ	15-30	10,000 - 20,000
		කුඩා පරිමාණ	<15	1,000 - 10,000
08	අනෙකුත් වාණිජ ආයතන (රාජ්‍ය/පුද්ගලික)	මහා පරිමාණ	>30	15,000 - 40,000
		මධ්‍ය පරිමාණ	10-30	5,000 - 15,000
		කුඩා පරිමාණ	<10	500 - 5,000
09	සේවා සපයනු ලබන ආයතන (රාජ්‍ය/පුද්ගලික)	මහා පරිමාණ	>10	5,000 - 22,000
		මධ්‍ය පරිමාණ	5-10	2,500 - 5,000
		කුඩා පරිමාණ	<5	500 - 2,500

අංකය	*වර්ගය*	*අපද්‍රව්‍ය ජනනය අනුව වර්ගීකරණය*	*දිනකට අපද්‍රව්‍ය ප්‍රමාණය (Kg)*	*අදාළ ගාස්තුව රු.*
10	ආගමික ස්ථාන	මහා පරිමාණ	>25	5,000 - 15,000
		මධ්‍ය පරිමාණ	5-25	1,000 - 5,000
		කුඩා පරිමාණ	<5	500 - 1,000

12-240/8

ජා - ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළ ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1994 හා 2016.11.18 වැනි දින ගැසට් නිවේදනයෙන් වැළඳගන්නට යෙදුනු බස්නාහිර පළාත් පළාත් සභාව අනුමත කරන ලද අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට් නිවේදනයේ* ප්‍රචාරක දැන්වීම් සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මත IV වන වගන්තිය අනුව, ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, ප්‍රාදේශීය සභා හෝ පෞද්ගලික මාර්ග යට පෙනෙන සේ, පුවරු, බැනර්, කටවුට්, ඇළුමිනියම් තහඩු, යකඩ, පොලිතින්, රෙදි හෝ කොළවල ඇඳීමෙන් ද, නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක් ද, නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදී ස්ථානයක අකුරු හෝ රූප යොදා යම් වෙළඳ ස්ථානයක්, වෙළඳ භාණ්ඩයක්, ව්‍යාපාරයක් සඳහා කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ද, වෙළඳ ප්‍රදර්ශනයක, සැණකෙළියක ආදී උත්සව අවස්ථාවන් හි යොදන, විශේෂ දැන්වීම් පුවරු සඳහා ද 2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තුවක් අය කිරීමට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

අනු. අංකය	*පුවරුවේ ස්වභාවය*	*වර්ග මීටර් ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03 ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක් සඳහා*
01	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක්	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		

අනු. අංකය	ප්‍රචාරුවේ ස්වභාවය	වර්ග මීටර් ප්‍රමාණය	ගාස්තුව රුපියල්		
			මාස 03 ට අඩු	මාස 03 හෝ 06 අතර	වසරක් සඳහා
02	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	3 ට අඩු	250	350	500
		3 ට වැඩි	3 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
03	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
04	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	500	750	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300 බැගින්		
05	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
06	ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	250	350	500
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200 බැගින්		
07	විද්‍යුත් උපකරණ යොදාකරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1 ට අඩු	750	850	1,000
		1 ට වැඩි	1 ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500 බැගින්.		

ජා - ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළ ආදාහනාගාර ගාස්තු

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, ජා ඇල ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය් අංක 1994 හා 2016.11.18 වැනි දින *ගැසට්* නිවේදනයෙන් වැළඳගන්නට යෙදුනු බස්නාහිර පළාතේ පළාත් සභා අනුමත කරන ලද අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට්* නිවේදනයේ ආදාහනාගාර ගාස්තු සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මත IV වන වගන්තිය අනුව, 2023 වර්ෂයට පහත උපලේඛනයේ දක්වෙන පරිදි ගාස්තු පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

අය කළ යුතු ගාස්තු :	*රු. ශත*
ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිව සිට මියගිය තැනැත්තෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීම	8,500 0
ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිට මියගිය තැනැත්තෙකුගේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට	10,000 0
ආනියාකන්ද පොදු සුසාන භූමියේ මෘත ශරීරයක් භූමදානය සඳහා	1,000 0
සභාව සතු පොදු සුසාන භූමියේ ආගමික ලාංඡන ඇතුළත් කර සිහිවටනයක් සිටුවීම සඳහා	2,500 0
ආනියාකන්ද හැර අනෙක් සභාව සතු පොදු සුසාන භූමිවල මෘත ශරීරයක් භූමදානය සඳහා	1,000 0

12 - 240/10

ජා - ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව සේවා ගාස්තු අය කිරීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, ජාඇල ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1994 හා 2016.11.18 වැනි දින *ගැසට්* නිවේදනයෙන් වැළඳගන්නට යෙදුනු බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරන ලද අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට්* නිවේදනයේ සේවා ගාස්තු අයකිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මත IV වන වගන්තිය අනුව, 2023 වර්ෂයට පහත සඳහන් පරිදි සේවා ගාස්තු අය විය යුතු බවට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

ඉල්ලුම්පත් ගාස්තු :

	රු. ශත
01. සභාව විසින් පවත්වා ගෙන යනු ලබන පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත් ගාස්තුව	
පාසල් ළමුන් සඳහා	50 0
අනෙක් අය සඳහා	100 0
02. වරිපනම් ලේඛනයේ නම ඇතුළත්කර ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තුව	250 0
03. නොපවරවා ගැනීමේ සහතිකයක් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තුව	250 0
04. වරිපනම් ලේඛනයේ නම ඇතුළත් කිරීමේ පරීක්ෂණ ගාස්තුව	1,000 0
05. සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ පෝරම ගාස්තු	500 0
06. විථිරේඛා සහතිකයක් ලබා ගැනීමේ ඉල්ලුම්පත් ගාස්තුව	250 0
07. ගොඩනැගිලි/පිඹුරුපත් සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත් ගාස්තුව	1,000 0
08. වන්දි රහිත ගිවිසුම් පෝරම ගාස්තු	1,000 0

13. කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු සංශෝධනය කිරීම :

අංකය	*සැපයුම්/කොන්ත්‍රාත් සීමාව*	*ලියාපදිංචි ගාස්තු*
		රු. ශත
01.	රු. 0 - රු. 5,00,000.00 දක්වා වසරකට	5,000 0
02.	රු. 5,00,000.00 සිට රු.20,00,000.00 දක්වා	7,500 0
03.	රු. 20,00,000.00 සිට රු. 50,00,000.00 දක්වා	15,000 0
04.	රු. 50,00,000.00 ට වැඩි	20,000 0

සහතික පත්‍ර නිකුත් කිරීමේ ගාස්තු :

01. අනුමත ගොඩනැගිලි සැලැස්මක සත්‍ය පිටපතක් ලබා ගැනීමේ ගාස්තුව	1,000 0
02. අමතර වාර්ෂික වරිපනම් දැන්වීමක් ලබාගැනීමේ ගාස්තුව	100 0
03. වරිපනම් උදෘත වසරක් සඳහා ලබා ගැනීමේ ගාස්තුව	500 0

12-240/11

ජා - ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව සංචාරක වෙළඳාම පිළිබඳ ගාස්තු පැනවීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, ජාඇල ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1994 හා 2016.11.18 වැනි දින ගැසට් නිවේදනයෙන් වැළඳගන්නට යෙදුනු බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරන ලද අංක 1947/6 හා 2015.12.28 දිනැති ගැසට් නිවේදනයේ සංචාරක වෙළඳාම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මත III වන වගන්තිය අනුව ජා-ඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පාරක, මංමාවතක, පොදු උද්‍යානයක, ක්‍රීඩාංගනයක හෝ වෙනත් යම් පොදු ස්ථානයක යම් කවර හෝ භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ආහාරයක් අතින් රැගෙන ගොස් බයිසිකලයක, ට්‍රයිසිකලයක,

කරත්තයක හෝ වෙනත් යම් වාහනයක එහා මෙහා රැගෙන යමින් විකිණීම හෝ විකිණීම සඳහා තබා ගැනීම 2023 වර්ෂයට අවසර පත්‍රයක් නිකුත් කිරීම පිළිබඳ පහත සඳහන් පරිදි ගාස්තු පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
කඳාන,
ජාඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

	රු. ශත
සංචාරක වෙළෙඳාම සඳහා අවසර පත්‍ර ගාස්තු	1,000 0

12-240/12

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව ක්‍රීඩා භූමි ගාස්තු අය කිරීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1994 හා 2016.11.18 වැනි දින *ගැසට්* නිවේදනයෙන් වැළඳගන්නට යෙදුනු බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරන ලද අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට්* නිවේදනයේ ක්‍රීඩා භූමි ගාස්තු අය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන මත IV වන වගන්තිය අනුව, 2023 වර්ෂයට පහත සඳහන් පරිදි ගාස්තු අය විය යුතු බවට යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

	රු. ශත
ක්‍රීඩා පිටිය වෙන්කිරීමේ ගාස්තු	1,000 0

12-240/13

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළව පෝරම නොවන ගාස්තු අය කිරීම

ජා-ඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2022.09.12 වැනි දින මහ සභා සම්මුතිය මත 2023 වර්ෂයට පහත සඳහන් පරිදි සේවා ගාස්තු අයවිය යුතු බවට මම යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජාඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

	රු. ශත
01. දෛනික සංචාරක නොවන වෙළඳුන්ගෙන් අය කිරීම	50.00/100.00/150.00
02. කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 1ක් සඳහා මුදල	20.00
03. කොම්පෝස්ට් පොහොර ටොන් 1ක් සඳහා මුදල	10,000.00

12-240/14

ජා-ඇල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂයට අදාළ පරිසර ආරක්ෂණ බලපත්‍රය සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම

ජාඇල ප්‍රාදේශීය සභාව විසින් 2022 ඔක්තෝබර් මස 10 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2022.10.10 වැනි දින මහ සභා සම්මුතිය මත 2023 වර්ෂයට පහත සඳහන් ගාස්තු අය කළ යුතු බව මම යෝජනා කරමි.

චන්ද්‍රපාල මදුරප්පෙරුම,
සභාපති,
ජා-ඇල ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
ජා-ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

උපලේඛනය

පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීමට ප්‍රමාද වී යොමු කරන අයදුම්පත් සඳහා

01. පළමු මාස තුන දක්වා ප්‍රමාද වුවහොත් ප්‍රමාද ගාස්තුව	-	පරීක්ෂණ ගාස්තුවෙන් 10% ක්
02. මාස තුනට වඩා ප්‍රමාද වුවහොත් ප්‍රමාද ගාස්තුව	-	පරීක්ෂණ ගාස්තුවෙන් 20% ක්

12-240/15

පේදුරුතුඩුව නගර සභාව

දේපළ බදු අයකිරීම - 2023

නගර සභා ආඥාපනතේ 255 වැනි කොටසේ 166 වැනි ඡේදය යටතේ පේදුරුතුඩුව නගර සභාවට ඇති බලතල අනුව 2022.08.24 වැනි දින තීරණය අංක C207/2022 මත තීරණය කරන ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

යෝසෙප්පු ඉරුදයරාසා,
සභාපති ,
පේදුරුතුඩුව නගර සභාව.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

යෝජනාව

යෝජනා අංකය: C 207 / 2022

නගර සභා ආඥාපනතේ 255 වැනි කොටසේ 166 වැනි ඡේදය යටතේ පේදුරුතුඩුව නගර සභාවට පවරන ලද බලතලවලට අනුව ප්‍රදේශය තුළ පිහිටා ඇති නිවාස, ගොඩනැගිලි, ඉඩම්, කුඩා නිවාස යනාදියට නියම කරන ලද බලතල ප්‍රකාරව එම දේපළ මත තක්සේරු කරන ලද වර්ෂයේ වටිනාකමින් සියයට දහයක් (10%) බැගින් වාර්ෂික දේපළ බද්ද අය කළ යුතුය.

තව ද, 2023 වර්ෂයේ පහත උපලේඛනයේ සඳහන් කර ඇති සෑම කාර්තුවට අනුරූප සඳහන් කර ඇති දිනට පෙර වාර්ෂික වරිපනම් බදු පේදුරුතුඩුව නගර සභා අරමුදලට ගෙවිය යුතු බවත්, වර්ෂයේ කාර්තු හතර සඳහා වරිපනම් බදු ජනවාරි මස 31 වැනි දිනට පෙර ගෙවනු ලැබුවහොත් සියයට දහය (10%) ක වට්ටමක් ද මෙම උපලේඛනයේ සෑම කාර්තුවක් ඉදිරිපිට III වැනි තීරුවේ සඳහන් කර ඇති දිනට පෙර අදාළ වරිපනම් මුදල් පේදුරුතුඩුව නගර සභා අරමුදලට ගෙවනු ලැබුවහොත් එක් කාර්තුවකට අදළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද පේදුරුතුඩුව නගර සභාව විසින් ගෙවිය යුතු බවත්, නියමිත කාර්තුව තුළ වරිපනම් බදු නොගෙවනු ලැබුවහොත් ඒ සඳහා පුරන් බිම පදිංචිවී සිටින ඉඩම් සඳහා සියයට පහළොවක (15%) දඩ මුදලක් ද, වෙළෙඳ ස්ථාන සඳහා සියයට විස්සක (20%) දඩ මුදලක් ද අය කරන බව තීරණය කරමි.

උපලේඛනය - 01

වාරිකය	*ගෙවිය යුතු දිනය*	*සියයට පහක වට්ටම සඳහා නියමිත අවසාන දිනය*
I වැනි කාර්තුව	2023.03.31 ට පෙර	2023.01.31
II වැනි කාර්තුව	2023.06.30 ට පෙර	2023.04.30
III වැනි කාර්තුව	2023.09.30 ට පෙර	2023.07.31
IV වැනි කාර්තුව	2023.12.31 ට පෙර	2023.10.31

12-279/1

පේදුරුතුඩුව නගර සභාව

ව්‍යාපාර හස්ත කර්මාන්ත බලපත්‍ර මත ගාස්තු අයකිරීම- 2023

යෝජනාව:- C208 /2022

පේදුරුතුඩුව නගර සභාවේ සභාපති යෝසෙප්පු ඉරුදයරාසා වන මම 1939 වසරේ අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 184 (අ) කොටස සමග කියවිය යුතු එම ආඥාපනතේ අංක 162, 164, 165 (අ) වැනි කොටස්වලින් මා වෙත පවරන ලද බලතලවලට අනුකූලව පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශය තුළ මෙහි දැක්වෙන වගුවෙහි 1 වැනි තීරයේ සඳහන් කර

ඇති කිසියම් කර්මාන්තයක් 2023 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරනු ලබන ව්‍යාපාර බලපත්‍ර සඳහා එම කර්මාන්තය කරනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ සඳහන් කර ඇති ගාස්තු සීමාවන් තුළ පවතින අවස්ථාවල දී ඊට අනුරූප වගුවේ සඳහන් කර ඇති ගාස්තුව පනවා අය කිරීමට තීරණය කරමි.

යෝසෙප්පු ඉරුදයරාසා,
සභාපති ,
පේදුරුතුඩුව නගර සභාව.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

උපලේඛනය - 01

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම 751-1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම 1,501 ට වැඩි රු. ශත*
1	බුලත් හා රසකල බුලත් විට වර්ග විකිණීම	500 0	750 0	1,000 0
2	සත්ත්ව ආහාර විකිණීම	500 0	750 0	1,000 0
3	දත් හා ඇස් කණ්නාඩි පරීක්ෂා කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
4	භාණ්ඩ ගබඩා කර වාහනවලින් තොග වශයෙන් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
5	රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6	වාහනවලින් බේකරි නිෂ්පාදන හා කෙටිකෑම වර්ග අලෙවි කිරීම - ත්‍රීරෝද රථ මගින්	500 0	750 0	1,000 0
7	වාහනවලින් බේකරි නිෂ්පාදන හා කෙටි කෑම වර්ග අලෙවි කිරීම - පාපැදි මගින්	500 0	750 0	1,000 0
8	වාහන වලින් බේකරි නිෂ්පාදන හා කෙටි කෑම වර්ග අලෙවි කිරීම - වෑන් රථ මගින්	500 0	750 0	1,000 0
9	තේ පැන් හා කෙටි කෑම වර්ග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
10	ආහාර, තේ පැන් හා කෙටි කෑම වර්ග අලෙවි කිරීම	500 0	750 0	1,000 0
11	උසස් ගණයේ භෝජනාගාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12	අයිස් ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
13	පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14	ඇසුරුම් කරන ලද ආහාර විකිණීම	500 0	750 0	1,000 0
15	ඇඹරුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16	රෙදි සෝදන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17	පාන් බිස්කට් අලෙවි කිරීම	500 0	750 0	1,000 0
18	ලී ඉරුම් වලක් පවත්වාගෙන යාම (යාන්ත්‍රික)	500 0	750 0	1,000 0
19	මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානය (ගරාජ්) හා වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20	කරවල නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
21	රා තැබෑරුමක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22	යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23	ලී බඩු නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම (යන්ත්‍රානුසාරයෙන්)	500 0	750 0	1,000 0
24	යාන්ත්‍රික ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25	තල් නිෂ්පාදනය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26	රසායන ද්‍රව්‍ය රැස්කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27	කෙටිකෑම වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28	වාහන වලින් අයිස්ක්‍රීම්ල අයිස්පළම් අලෙවි කිරීම - ත්‍රීරෝද රථ	500 0	750 0	1,000 0
29	වාහන වලින් අයිස්ක්‍රීම්, අයිස්පළම් අලෙවි කිරීම -වෑන් රථ	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
	ව්‍යාපාරයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම 750 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම 751-1,500 දක්වා රු. ශත*	*වාර්ෂික වටිනාකම 1,501 ට වැඩි රු. ශත*
30	කිරි මණ්ඩලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31	පිසින ලද ආහාර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
32	ලේ, මුත්‍රා පරීක්ෂා කිරීම සඳහා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33	කුකුලන් විකිණීම හා කුකුලන් ඇති කිරීම	500 0	750 0	1,000 0
34	මුහුදු ආහාර මිලදී ගැනීම, විකිණීම හා පදම් කිරීම	500 0	750 0	1,000 0
35	තනිපුද්ගල කොණ්ඩා සැකසුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36	බහු පුද්ගල කොණ්ඩා සැකසුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37	මුහුදු ආහාර ප්‍රවාහන සේවය (වියළි)	500 0	750 0	1,000 0
38	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39	නවාතැන්පලක් පවත්වාගෙන යාම- සාමාන්‍ය නිදන කාමර පහසුකම් සහිතව	500 0	750 0	1,000 0
40	නවාතැන් පලක් පවත්වාගෙන යාම-වායුසමීකරණය කළ නිදන කාමර පහසුකම් සහිතව	500 0	750 0	1,000 0

12-279/2

පේදුරුතුඩුව නගර සභාව

ව්‍යාපාර බදු අයකිරීම - 2023

යෝජනාව:- C209/2022

පේදුරුතුඩුව නගර සභාවේ සභාපති යෝසෙප්පු ඉරුදයරාසා මම 1939 වසරේ අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 184 (අ) කොටස සමග කියවිය යුතු එම ආඥාපනතේ 165 (අ) වැනි කොටසින් මා හට පවරන ලද බලතලවලට අනුකූලව, එම ආඥාපනතේ 164 (අ) කොටසේ විධිවිධාන යටතේ බලපත්‍ර නොගත්, 165 (අ) කොටස යටතේ හස්ත කර්මාන්ත බද්ද ගෙවීමට යටත් නොවන සහ පේදුරුතුඩුව නගර සභා ප්‍රදේශයේ පවත්වාගෙන යන එක් එක් ව්‍යාපාර වෙනුවෙන් එම ව්‍යාපාර පවත්වාගෙන යන අය විසින් නියමිත බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලැබූ ආදායම අනුව පහත දැක්වෙන ප්‍රතිශතයකට වැඩි නොවන ව්‍යාපාර බද්ද 2023 අප්‍රේල් මස පළමුවැනි දිනට පෙර පේදුරුතුඩුව නගර සභාවට ගෙවිය යුතු බව තීරණය කරමි.

යෝසෙප්පු ඉරුදයරාසා,
සභාපති,
පේදුරුතුඩුව නගර සභාව.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

අංකය	*I වැනි තීරුව 2022 වසරේ ආදායම*	*II වැනි තීරුව රු. ශත*
i.	රු. 6,000 ට වැඩි නොවන විට	නැත
ii.	රු. 6,000 ට වැඩි සහ රු 12,000 ට අඩුවන විට	90 0
iii.	රු. 12,000 ට වැඩි සහ රු 18,750 ට අඩුවන විට	180 0
iv.	රු. 18,750 ට වැඩි සහ රු 75,000 ට අඩුවන විට	360 0
v.	රු 75,000 ට වැඩි සහ රු 1,50,000 ට අඩුවන විට	1,200 0
vi.	රු 1,50,000 ට වැඩිවන විට	3,000 0

උපලේඛනය

ව්‍යාපාරයේ ස්වභාවය - තීරුව - I

1	සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම
2	සිල්ලර වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම තොග වශයෙන් සිල්ලර වශයෙන් විකිණීම
3	ස්වර්ණාභරණ විකිණීම(රන්,රිදී)
4	රෙදි විකිණීම
5	පාපැදි,අමතර කොටස් විකිණීම
6	පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7	තනි පුද්ගල මැහුම් ස්ථානයක් පවත්වාගෙන යාම
8	බහු පුද්ගල මැහුම් ස්ථානයක් පවත්වාගෙන යාම
9	රූපලාවන්‍ය භාණ්ඩ විකිණීම
10	ඕඩියෝ හා වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම
11	පාවහන් හා සම් භාණ්ඩ විකිණීම
12	ඡායා පිටපත් හා සන්නිවේදන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
13	පොත් අලෙවි කිරීම හා ලිපි ද්‍රව්‍ය අලෙවි කිරීම
14	විදුලි උපකරණ විකිණීම
15	ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
16	යතුරුපැදි හා අමතර කොටස් විකිණීම
17	රියැදුරු පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
18	පරිගණක පුහුණු ආයතනයක් පවත්වාගෙන යාම
19	බෝට්ටු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා අමතර කොටස් විකිණීම
20	ගොඩනැගිලි ද්‍රව්‍ය හා තීන්ත වර්ග විකිණීම
21	ඡායාරූප හා එළිමහන් ඡායාරූප ගැනීම
22	පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23	රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලියන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
24	ටියුබ් වල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ටයර්,ටියුබ්)
25	පුවත්පත් අලෙවි කිරීම
26	පරණ යකඩ විකිණීම
27	ධීවර ආම්පන්න විකිණීම
28	සිමෙන්ති විකිණීම සහ ගබඩාකර තබා ගැනීම
29	උත්සව සඳහා මගුල්පෝරු,උපකරණ හා ගෘහ භාණ්ඩ කුළියට දීම
30	ශීතකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31	සිමෙන්ති ගල් නිෂ්පාදනය හා විකිණීම
32	ප්ලාස්ටික් භාණ්ඩ හා ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33	ස්ප්‍රේ (ඉසිනය) තීන්ත වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
34	ඇලුමිනියම් භාණ්ඩ හා එවර්සිල්වර් භාණ්ඩ අලෙවි කිරීම
35	සහල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36	පරිගණක අලුත්වැඩියා කිරීම හා පරිගණක උපාංග අලෙවි කිරීම
37	පරිගණක මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
38	ජංගම දුරකථන අලෙවි කිරීම හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39	භාණ්ඩ ගබඩා කර වාහන වලින් තොග වශයෙන් අලෙවි කිරීම
40	ඇලුමිනියම් වැද්දුම් කිරීම
41	ළමයින් සඳහා විවිධ භාණ්ඩ විකිණීම
42	යතුරු ලේඛනය හා භාෂා පරිවර්තන සේවය ලබා දීම
43	ප්‍රචාරක සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
44	ගෑස් සිලින්ඩර් අලෙවි කිරීම
45	වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම
46	කම්මලක් පවත්වාගෙන යාම
47	ලී මෝල් (පොල්, තල්, පුවක් පරාල විකිණීම)
48	දර විකිණීම
49	ටින්කර් වැඩපලක් පවත්වාගෙන යාම

50 කට්ටුමරම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51 බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52 තහඩු භාණ්ඩ පෑස්සුම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53 බෝට්ටු යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54 ඇලුමීනියම් භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම
55 දැව් තෙල් සහ සමාන ද්‍රව්‍ය විකිණීම
56 සපත්තු, සම්භාණ්ඩ හා කුඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම
57 මල් ගස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58 ක්‍රීඩා උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59 සංවර්ධන ලොතරැයි අලෙවි කිරීම
60 ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීම
61 ජල පොම්ප සවි කිරීම
62 ප්‍රවාහන නියෝජිතයන්
63 කායවර්ධන /ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
64 නල සවිකරන්නන්
65 නියෝජිත මුදල් මාරු කිරීමේ සේවය ලබාදීම
66 කේබල් රූපවාහිනී සේවය ලබාදීම
67 පුද්ගලික මූල්‍ය/රක්ෂණ ආයතන
68 දේශීය හෝ විදේශීය බැංකුවක් පවත්වාගෙන යාම
69 ATM/CDM යන්ත්‍ර සඳහා
70 සුපිරි වෙළඳ සැලක් පවත්වාගෙන යාම
71 උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
72 ඉන්ධන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73 දුරකථන සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
74 මත්පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75 දේශීය ඖෂධ විකිණීම
76 බටහිර ඖෂධ විකිණීම

ව්‍යාපාර බදු අයකිරීම්

1 නොතාරිස් හා නීතිඥ සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
2 වෙන්දේසිකරුවන්
3 තැරැව්කරුවන්
4 පෞද්ගලික අධ්‍යාපන මධ්‍යස්ථානය හා රියැදුරු පුහුණු පාසල් පවත්වාගෙන යාම
5 සීට්ටු ඇදීම
6 වෛද්‍ය සේවය ලබාදීම
7 අනුමැතිය ලත් සැලසුම් ශිල්පීන්
8 අනුමැතිය ලත් මිනින්දෝරුවන්
9 කොන්ත්‍රාත්කරුවන්- ඉක්‍රාට් ශ්‍රේණිය- C9
10 කොන්ත්‍රාත්කරුවන්- ඉක්‍රාට් ශ්‍රේණිය- C8
11 කොන්ත්‍රාත්කරුවන්- ඉක්‍රාට් ශ්‍රේණිය- C7 සහ ඊට ඉහළ

12-279/3

පේදුරුතුඩුව නගර සභාව

සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අයකිරීම – 2023

පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශයේ බලය ක්‍රියාත්මක කරන හා සේවාවන් ඉටුකරනු ලබන පේදුරුතුඩුව නගර සභාවේ සභාපති යෝසෙප්පු ඉරුදයරාසා වන මම, 1939 වසරේ අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 164 (2) වැනි කොටසින් මා වෙත පවරන ලද බලය අනුව පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශය සඳහා 2023 වර්ෂයට බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම්

ප්‍රදර්ශන කිරීම සඳහා ගාස්තු අයකිරීම පහත දැක්වෙන පරිදි විය යුතු බව 2022.08.24 වැනි දින තීරණ අංක C210/2022 යටතේ තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

සෝසෙප්පු ඉරුදයරාසා,
සභාපති ,
පේදුරුතුඩුව නගර සභාව.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

යෝජනාව:- C 210/2022

උතුරු පළාතේ පළාත් පාලන කටයුතු භාර ඇමතිතුමා මගින් පිළියෙල කොට 2016.02.02 වැනි දින අංක 1952/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර උතුරු පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින අනුමත කොට 2017.03.24 වැනි දින අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) අනුකොටසේ පළකරන ලද උතුරු පළාත් නගර සභාවන් සඳහා උප ව්‍යවස්ථාවේ 4 වැනි පරිච්ඡේදයට අනුව පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා පහත දැක්වෙන වගුවේ සඳහන් කර ඇති ආකාරයට ගාස්තු අයකිරීමට මම තීරණය කරමි.

උපලේඛනය

ගාස්තු - රුපියල්

අනු. අංකය	*ප්‍රචාරුවල ස්වභාවය*	*වර්ග අඩි*	*මාසයකට අඩු රු. ශත*	*මාස 3 සිට මාස 6 දක්වා රු. ශත*	*මාස 6 සිට අවුරුද්දක් ඇතුළත රු. ශත*
1	කුමන හෝ බිත්තියක් හෝ තාප්පයක් මත ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සඳහා	1	25 0	30 0	35 0
2	රෙදි හෝ ඩිජිටල් පුවරු මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් සඳහා	1	15 0	20 0	25 0
3	තහඩු හෝ ලෑලිවලින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1	30 0	40 0	60 0
4	විදුලිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	1	35 0	55 0	110 0

12-279/4

පේදුරුතුඩුව නගර සභාව

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2023

තීරණ අංක - C 211/2022

පේදුරුතුඩුව නගර සභාවේ භාණ්ඩාගාරික සභාපති යෝසෙප්පු ඉරුදයරාසා වන මම 1939 වර්ෂයේ අංක 61 දරන නගර සභා ආඥාපනතේ (255 වන වගන්තිය) 184 අ දරන ඡේදය එකතුකර කියවිය යුතු එම ආඥාපනතේ 160 වැනි වගන්තිය යටතේ පවරා ඇති

බලතල ප්‍රකාර පේදුරුතුඩුව නගර සභාවෙන් ප්‍රදානය කරන පහත සඳහන් සේවාවන්ට අදාළ නියෝගය 2023.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව මෙමගින් දන්වා සිටිමි.

යෝසෙප්පු ඉරුදයරාසා,
සභාපති ,
පේදුරුතුඩුව නගර සභාව.

2022 නොවැම්බර් මස 24 වැනි දින,
නගර සභා කාර්යාලය,
පේදුරුතුඩුව.

නේමාව	*ගාස්තුව රු. ශත.*
බයිසිකල් අයිතිය	500 0
සුනඛ අයිතිය	100 0
මාර්ග සීමා රේඛා සහතික ගාස්තුව	500 0
දේපළ නම මාරු කිරීම අලුත් කිරීමේ ගාස්තුව	1,000 0
අත්පත් කර නොගැනීමේ සහතිකය අයිතිය පිළිබඳ සහතික ගාස්තුව	750 0
සම්පාදක ලියාපදිංචි ගාස්තුව	1,000 0
දඩමුදල් (ප්‍රුස්තකාල පොත් - එක පොතක් දිනක පමාවට)	5 00
දේපළ නම වෙනස් කිරීමේ ආකෘති පත්‍ර ගාස්තුව	250 0
පරිසර රක්ෂණ අයිතිය	3,000 0
පරිසරය සෝදිසි කිරීමේ ගාස්තුව	5,000 0
ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තුව	3,500 0
සැකසුම් සහතික අයදුම් කිරීමේ ගාස්තුව	300 0
සැකසුම් සහතික ගාස්තුව	6,000 0
මළ අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ ගාස්තුව (ගලි බවුසරය)	8,000 0
මළාපවාහනය කිරීමේ ගාස්තුව (ගලි බවුසරය)	6,000 0
සාතන ස්ථානය සඳහා ගාස්තුව (ගවයෙකු, එළුවකු)	750 0
පරිසර රක්ෂණ අයදුම් පත්‍ර ගාස්තුව	150 0
වෛද්‍ය සහතික ගාස්තුව	300 0
වීදිගෝලයේ කුලිය (එක් දිනකට)	300 0
කෙටුම්පත් සම්පාදක ගාස්තුව (නව ලියාපදිංචිය සඳහා)	2,000 0
කෙටුම්පත් සම්පාදක ගාස්තුව (අලුත් කිරීම)	1,000 0
උප කොටස් කිරීමේ අයදුම්පත් ගාස්තුව	250 0
ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව	600 0
ටෙන්ඩර්පත් ගාස්තුව (වැඩ හා සේවාවන්)	3,000 0
ටෙන්ඩර්පත් ගාස්තුව (බඳවා ගැනීම, කුලී පදනම)	1,500 0
ටෙන්ඩර්පත් ගාස්තුව (වෙන්දේසි ටෙන්ඩර්)	500 0
ටෙන්ඩර්පත් ගාස්තුව (ළමා විනෝදාංශ)	500 0
පිටිය සඳහා කුළිය (පිට්ටනිය) (දිසාකොන, වෙරළ, නඩරාජර් කලෙයරංගම්)	5,000 0
පානීය ජල ගාස්තුව (ලීටර 1 කට)	2 0
පානීය ජල ටැංකි කුළිය (දිනකට)	500 0

තේමාව	*ගාස්තුව රු. ශත.*
පානීය ජල ටැංකි ස්ථාවරය (දිනකට)	500 0
පුස්තකාල දායකත්වය අලුත් කිරීමේ ගාස්තුව	50 0
භූමදාන ගාස්තුව	1,500 0
පුස්තකාල අයදුම්පත් ගාස්තුව	50 0
පුස්තකාල සාමාජික තැන්පත්	200 0
වෙළෙඳ දූන්වීම් ප්‍රවර්ධන ගාස්තුව (නව වෙළඳ පොළ පිටුපස පැත්ත) වාහන	7,500 0
වෙළෙඳ දූන්වීම් ප්‍රවර්ධන ගාස්තුව (සෙවනැලි කුඩය)	1,500 0
දූන්වීම් ප්‍රවර්ධන ගාස්තු - කුඩාරම්	3,500 0
වෙළෙඳ දූන්වීම් ප්‍රවර්ධන ගාස්තුව (මෙට්ට කඩය හන්දිය පිටත) වාහන	2,500 0
පා පැදි ආරක්ෂක ගාස්තු	10 0
පා පැදි ආරක්ෂක ගාස්තු (පැය 6ට වැඩි කාලයක් නවතා තිබීම)	20 0
යතුරු පැදි ආරක්ෂක ගාස්තු	30 0
යතුරු පැදි ආරක්ෂක ගාස්තු (පැය 6ට වැඩි කාලයක් නවතා තිබීම)	70 0
බස් රථ නතර කිරීමේ ගාස්තු (වරකට)	20 0
බස් රථ නතරකිරීමේ ගාස්තු පිට දිස්ත්‍රික් (වරකට)	30 0

ගොඩනැගිලි අයදුම්පත් පරීක්ෂා කිරීමේ ගාස්තුව (වර්ග මීටරය)	*නිවසේ රු. ශත*	*ව්‍යාපාරික රු. ශත*
45 පහත	500 0	1,000 0
45 - 90	1,500 0	2,000 0
91 - 180	2,500 0	3,000 0
181 - 270	3,500 0	4,000 0
271 - 450	4,500 0	6,000 0
451 - 675	5,500 0	8,000 0
676 - 900	6,500 0	10,000 0
901 - 1,225	7,500 0	12,000 0
1,225 ඉහත	7,500 0	12,000 0
වර්ග මීටර් 1,226 ට වැඩි සෑම මීටර් අනූවක් සඳහා	1,000 0	1,250 0
ඉඩම් උප අංශ පරීක්ෂණ ගාස්තු (වර්ග මීටරය)		
150-300		500 0
301-600		400 0
601-900		300 0
900 ඉහළ		200 0
සමීක්ෂණ සැලසුම් සහතික කිරීමේ ගාස්තුව		1,000 0

නිවාස හා නිවාස නොවන ගොඩනැගිලි සඳහා බලපත්‍රය	*නිවාස*	*නිවාස (තනි නිවස)*	*නිවාස නොවන (තට්ටු ගෙවල්)*
		රු. ශත	*රු. ශත*
ව. මී. 400 දක්වා (වර්ග මීටරය)			
ව. මී. 401 - ව. මී. 1,000 දක්වා	20	25 0	25 0
ව. මී. 1,001 - ව. මී. 1,500 දක්වා	22	27 0	27 0
ව. මී. 1,501 - ව. මී. 2,000 දක්වා	25	30 0	30 0
ව. මී. 2,000 වලට ඉහළ එක් එක් අමතර ව. මීටර 90 ට ද	25	32 0	32 0
	2,000 0	2,000 0	2,000 0
විෂබීජ නාශක සඳහා ගාස්තු (එක් වරක්)			
යතුරු පැදිය			100 0
ත්‍රිරෝද රථය			150 0
මෝටර් රථ/බස්/අනික්			200 0
නිවස			750 0
විවාහ ශාලාව (එක් මහලක්)			1,500 0
පොදු ප්‍රවාහන සේවය			100 0
සුඛෝපභෝගී බස් රථයක්			300 0
ගවයෙකු ඇල්ලීම සඳහා ගාස්තුව			500 0
ගවයෙකු නඩත්තු කිරීම සඳහා වියදම් (දිනකට)			750 0
ගවයෙකු නිදහස් කිරීම සඳහා දඩ මුදල්			3,500 0
එළුවෙකු ඇල්ලීම සඳහා ගාස්තුව			250 0
එළුවෙකු නඩත්තු කිරීම සඳහා වියදම් (දිනකට)			300 0
එළුවෙකු නිදහස් කිරීම සඳහා දඩ මුදල්			2,500 0
ගෙවීම් - වැසිකිළිය			10 0
තුඹලෙයි නැගෙනහිර විනෝදාස්වාද වෙරළ ඇතුල්වීමේ ගාස්තුව වසය (අවුරුදු 12ට වැඩි අය සඳහා)			20 0
තුඹලෙයි නැගෙනහිර විනෝදාස්වාද වෙරළේ ව්‍යාපාරවල නිරත වන අයිස්ක්‍රීම් වාහනයක් සඳහා දිනකට අය කිරීම			200 0
තුඹලෙයි නැගෙනහිර විනෝදාස්වාද වෙරළේ ව්‍යාපාරවල නිරත වන හෑන්ඩ් ටෝස්ට් කරත්තයකට දිනකට අය කිරීම			100 0
තුඹලෙයි නැගෙනහිර විනෝදාස්වාද වෙරළේ ව්‍යාපාරවල නිරත වන වෙනත් වෙළෙන්දන් සඳහා දිනකට ගාස්තුව			100 0
දුම්බලෙයි නැගෙනහිර, හතරවන හරස් වීදිය ළමා විනෝදය ඇතුල්වීමේ ගාස්තුව වයස (අවුරුදු 12ට අඩු අය සඳහා)			20 0
ඝන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ගාස්තුව (1 ට්‍රැක්ටර් ලෝඩ්)			2,000 0
ඝන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ගාස්තුව (1/2 ට්‍රැක්ටර් ලෝඩ්)			1,250 0

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු නියම කිරීම

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 237/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අතුරු ව්‍යවස්ථාවක නියමය යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් 2023 වර්ෂය සඳහා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම වෙනුවෙන් ඒ යෝජනාවේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන්ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එම ආයතනය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපනශාලාවක් හෝ නවාතැන්පලක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපනශාලාවෙන් හෝ නවාතැන්පොලෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%) කට සමාන මුදල් ප්‍රමාණය හෝ ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත ප්‍රමාණය යන මුදල් ප්‍රමාණ දෙකෙන් වැඩි මුදලකට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් නියම කර අය කිරීමටත් මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

අනු. අංකය	*I වැනි තීරුව කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 751ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01.	ලැඟුම් නිවාස	500 0	750 0	1,000 0
02.	හෝටල්	500 0	750 0	1,000 0
03.	බත්කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
04.	බේකරි	500 0	750 0	1,000 0
05.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
06.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
07.	කොණ්ඩා සැකසීමේ සැලුන් හල් හා බාබර් සාප්පු	500 0	750 0	1,000 0
08.	සංචාරක වෙළෙන්දෝ	500 0	750 0	1,000 0
09.	පෞද්ගලික වෙළඳපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

අනු. අංකය	I වැනි තීරුව කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	II වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	රු. 751ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	රු. 1,501 ඉක්මවන අවස්ථාවක
		රු. ශ.	රු. ශ.	රු. ශ.
අප්‍රසන්න ව්‍යාපාර :				
10.	කිරිපට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
11.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
12.	මස් විකිණීම	500 0	750 0	1,000 0
13.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
14.	ගවගාල්	500 0	750 0	1,000 0
15.	ඝාතක මඩු	500 0	750 0	1,000 0

12-225/1

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද නියම කිරීම

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 වැනි දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 238/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා නියම කරන ලද ඒ කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද, 2023 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 152 වැනි වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත්වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් කර්මාන්තයක් (වෙළඳාමක්) කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ එක් එක් කර්මාන්තය (වෙළෙඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත (වෙළෙඳාම්) බද්දක් 2023 වර්ෂය සඳහා නියමකර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද 2023 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
		ස්ථානයේ වාර්ෂික වටිනාකම		
අනු. අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 751 ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,501 ඉක්මවන අවස්ථාවක*
		රු. ශ.	*රු. ශ.*	*රු. ශ.*
01.	හස්ත කර්මාන්ත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	කම්මලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	පැළ තවානක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	රසකැවිලි, මුරුක්කු ඇතුළු විවිධ ආහාර ද්‍රව්‍ය ඇසුරුම්කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
05.	බිම්මල් නිෂ්පාදනය කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0
06.	පැණි බීම ඇසුරුම් කර අලෙවි කිරීම	500 0	750 0	1,000 0

12-225/2

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බද්ද නියම කිරීම

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 239/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා නියම කරන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන, ඉහත කී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත්වන යම් කර්මාන්තයක් (වෙළෙඳාමක්) නොවන්නා වූ සහ කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේ දී ලැබූ ආදායම, පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ ව්‍යාපාර බද්ද 2023 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *බද්ද අදාළ වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු. ශත*
(i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
(ii) රු. 6,000 ඉක්මවන එහෙත් 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
(iii) රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
(iv) රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
(v) රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
(vi) රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

12-225/3

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

වාහන හා සත්ව බද්ද නියම කිරීම

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 240/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 148 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සත්ත්ව බද්දක් 2023 වර්ෂය සඳහා නියම කර අයකර ගැනීමට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

	රු. ශත
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
සෑම බයිසිකලයක්, ට්‍රයිසිකලයක්, බයිසිකල් කාරයක් හෝ කරත්තයක් :	
(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා	15 0
සෑම ඇතකු සඳහා	50 0

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ ''වෙළඳ කාර්යය'' යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-225/4

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

විනෝද බද්ද නියම කිරීම

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 241/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය (267 වන අධිකාරිය) යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත, ආඥාපනතේ විස්තර කර ඇති පරිදි විනෝද කටයුතු සඳහා ඇතුළුවීම වෙනුවෙන් අයකරන ගාස්තුවෙන් 10%ක ප්‍රතිශතයක් විනෝද බද්ද වශයෙන් 2023 වර්ෂයට පනවා අයකිරීමට මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-225/5

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම - ප්‍රචාරක දැන්වීම් ගාස්තු

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින පවත්වනු ලැබූ මහා සභාවේ තීරණ අංක 242/2022 යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ගාස්තුව දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 07කට වත් කලින් මෙම සභාවට ගෙවිය යුතු බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය හා 126 වැනි වගන්තිය යටතේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් සභාව මගින් සාදනු ලදුව 2017.06.09 දින අංක 2022/32 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ

කරන ලද කෙටුම්පත් සංශෝධන අතුරු ව්‍යවස්ථා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.03 දින අංක 2083 දරන *ගැසට් පත්‍රයේ* පල කරමින් වැළඳ ගන්නා ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථාවේ 06 වන අතුරු ව්‍යවස්ථාව යටතේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් මෙහි පහත උපලේඛනයේ සඳහන් මුදලක් 2023 වර්ෂය සඳහා මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට යෝජනා කරන්නීය.

උපලේඛනය

විස්තරය	*වර්ග අඩියකට ගාස්තුව*
1. තාවකාලික දැන්වීම් පුවරුවක් (මාස 03කට අඩු) සඳහා	රු. 50 0
2. ස්ථිර දැන්වීම් පුවරුවක් (වර්ෂයකට) සඳහා	රු. 100 0

12-225/6

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින තීරණ අංක 244/2022 යටතේ වරිපනම් කාර්යය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ ප්‍රදේශ බවට ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල පිහිටා ඇති නිශ්චල දේපළවල සහ ඒ ඒ පන්තියට හෝ වර්ගයට අයත් නිශ්චල දේපළවල 2022 වර්ෂය තුළ බල පැවැත්වූ වාර්ෂික වටිනාකම් 2023 වර්ෂය සඳහා එකී පනතේ 146 වැනි වගන්තියේ නියමය පරිදි, සම්මත කිරීමටත්,

ඉහත කී 134 වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල යටතේ එකී නිශ්චල දේපළ අතරින් කුඹුරු ඉඩම් හැර සෙසු සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් හා ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වරිපනම් බද්දක් 2023 වර්ෂය සඳහා නියම කිරීමටත් ; සහ

එකී වරිපනම්, 2023 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන්වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවන ලෙසට, එකී 134 වැනි වගන්තියේ 6 වැනි උපවගන්තිය යටතේ විධානය කිරීමටත්,

ඉහත කී වර්ෂයට අදාළ සම්පූර්ණ වරිපනම් මුදල 2023 ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් ඒ මුදලෙන් සියයට දහය (10%) ක වට්ටමක්, කිසියම් කාර්තුවකට අදාළ වරිපනම් මුදල ඒ කාර්තුවේ පළමුවන මාසය අවසන් වීමට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් ඒ කාර්තුවේ මුදලෙන් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලබන බවත්, ඒ ආකාරයෙන් යම් වට්ටමක් ලබා ගැනීමට හැකි වන්නේ අදාළ කාලයට පෙර පැවැති හිඟ වරිපනම් වේ නම්, ඒ හිඟය ද ගෙවා අවසන් කළහොත් පමණක් බවත් මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12-225/7

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින තීරණ අංක 243/2022 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැදිරිගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට, ස්ථාවර හෝ නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ ඉදිකර ඇති ගොඩනැගිල්ල මුළු බිම් ප්‍රමාණයෙන් 20න් 1ට වඩා අඩු වන්නේ නම්, හෝ
(ආ) විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති නම්, හෝ

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් සේ සැලකීමටත් එවැනි ඉඩමක මුළු භූමියේ ප්‍රාග්ධන වටිනාකමින් 0.5%ක වාර්ෂික බද්දක් 2023 වර්ෂයට පනවා අයකිරීමටත්, එම බද්ද 2023 වර්ෂයේ මාර්තු 31 දිනට හෝ ඊට ප්‍රථම මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරන්නීය.

12-225/8

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව

අනෙකුත් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් 2022.10.21 දින තීරණ අංක 245/2022 යටතේ පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ජී. යූ. එස්. කේ. වික්‍රමාරච්චි,
සභාපති,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 28 වැනි දින,
මැදිරිගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන පහත සඳහන් සේවාවන් සඳහා ඊට ඉදිරියෙන් දක්වා ඇති පරිදි 2023 වර්ෂය සඳහා ගාස්තු අයකළ යුතු බවට යෝජනා කරන්නීය.

මැදිරිගිරිය ප්‍රාදේශීය සභාව මගින් ලබාදෙන වාහන යන්ත්‍ර සූත්‍ර සඳහා කුලී :

යන්ත්‍රෝපකරණය	*අයකරන ගාස්තුව*	
	පැයක් සඳහා (යන්ත්‍ර ක්‍රියාකරු සමග)	*දිනක් සඳහා (යන්ත්‍ර ක්‍රියාකරු සමග) රු. ශත*
එකී පනතේ 134 වගන්තියේ (3) උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියම යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූ ද, ස්ථිර හෝ නීතිපතා ගොවිතැන් යටතේ වූ,

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් මත 2023 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වැනි උප වගන්තියේ අතුරු විධාන යටතේ පළත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (21) වන කොටසේ 1989.02.03 වැනි දිනැති *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත්කර ඇති හෙයින් හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා රුපියල් 50 බැගින් වන වාර්ෂික අක්කර බද්ද පනවා අය කිරීමට සහ;

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, සහ දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධානය කළ යුතු යැයි කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-245/1

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 31 දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් 2023 ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට (10%)ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක් (5%) වට්ටමක් ගෙවනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාස වල ගොඩනැගිලිවල, ඉඩම් වල හා ගෙවල්වල ද 2008 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, ඉහත කී වාර්ෂික වටිනාකමින්

අංක	දියුණු ගම් ප්‍රදේශය	වරිපනම් ප්‍රතිශතය
1.	රොසිටා නගරය	15%
2.	වූටන් නගරය	15%
3.	පතන නගරය	15%
4.	දෙවිසිරිපුර	15%
5.	වටගොඩ නගරය	10%
6.	බෝගහවත්ත නගරය	10%

2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ,

ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් කොටල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

12-245/2

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද ඒ වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත 2023 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක, එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්ද 2023 වර්ෂය සඳහා පනවා අයකරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

දෙවැනි කොටස

	I වන තීරුව *2022 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම්*	*II වන තීරුව* *අය කිරීමට තීරණය කළ මුදල* *රු. ශත*
(i)	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
(ii)	රු. 6,001 සිට රු. 12,000 දක්වා	90 0
(iii)	රු. 12,001 සිට රු. 18,000 දක්වා	180 0
(iv)	රු. 18,001 සිට රු. 75,000 දක්වා	360 0
(v)	රු. 75,001 සිට රු. 150,000 දක්වා	1,200 0
(vi)	රු. 1,50,001 වැඩි	3,000 0

12-245/3

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා ඇතැම් ඉඩම් විකිණීම මත බදු

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ සභා සම්මත කරන ලද යෝජනා අනුව 2023 වර්ෂයට ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මෙයින් දන්වමි.

1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්ති යටතේ කොටගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) සමාන බද්දක් 2023 වර්ෂය සඳහා වහා අයකළ යුතු බවටත්, එකී බද්ද විකිණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-245/4

කොටගල ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීම - 2023 වර්ෂය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරිය) 4 ඡේදයේ සඳහන් ප්‍රකාරව, 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පැවති මහ සභාවේ යෝජනා අංක 05.3 යටතේ සභා සම්මත වූ යෝජනාව අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් රුපියල් 10.00 බැගින් ද, බැල්ලියක් සඳහා රුපියල් 7.50 ක් බැගින් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ගාස්තුව 2023 වර්ෂයට ගෙවිය යුතු බවත්, මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-245/5

කොටගල ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේ දී කොටගල ප්‍රාදේශීය සභා විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මත 2023 මාර්තු 31 වන දිනට ප්‍රථම අදාළ ගාස්තු කොටගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව ද තවදුරටත් දන්වමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කොටගල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනය II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වන විට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එක (1%)කට සමාන ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*වාර්ෂික වටිනාකම*		
		රු. 750 දක්වා රු. ශත	*රු. 751 ට සිට රු. 1,500 දක්වා රු. ශත*	*රු. 1501 ට වැඩි රු. ශත*
1.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2.	බත්කඩ ආපන ශාලා තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3.	ලැගුම් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5.	සත්ත්ව ගොවිපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6.	කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් හෝ බියුටි සෙන්ටර් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7.	කිරිපිටි හෝ කිරි වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8.	මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9.	ජලය බෝතල් කිරීමේ ස්ථානයක් හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11.	ආහාර ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	මස් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	ඌරන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර			
1.	තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝ ග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
2.	මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
3.	මුද්‍රණාලයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
4.	කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් කොටුවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
5.	ගඩොල් හෝ උළු ගබඩා කොට තැබීම	500 0	750 0	1,000 0
6.	දර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
7.	කළුගල් ගැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්	500 0	750 0	1,000 0
8.	සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වට්ටිනාකම		
		රු. 750 දක්වා රු. ශත	රු. 751 ට සිට රු. 1,500 දක්වා රු. ශත	රු. 1501 ට වැඩි රු. ශත
9.	පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
10.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
11.	ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසින් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
12.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
13.	ස්වර්ණාභරණ නිෂ්පාදන හෝ අලුත්වැඩියා කිරීම්	500 0	750 0	1,000 0
14.	යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
15.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
16.	හිස්ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
17.	පාපැදි හෝ යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	පාවිච්චි කරන ලද පත්තර හෝ කඩදාසි ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
20.	ගිනිකෙලි භාණ්ඩ හා රතිඤ්ඤා ගබඩා කිරීම් හෝ නිපදවීම	500 0	750 0	1,000 0
21.	පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම්	500 0	750 0	1,000 0
22.	ශීතකළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
23.	දැව ගබඩා කිරීම	500 0	750 0	1,000 0
24.	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
25.	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
26.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
27.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
28.	හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම් හෝ අලුහුණු ගබඩා කිරීම	500 0	750 0	1,000 0
29.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
30.	මෝටර් වාහන සේවා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
32.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33.	ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34.	ආයුර්වේද ඖෂධ දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයොජනය කිරීම	500 0	750 0	1,000 0

අනු. අංකය	බලපත්‍රයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම		
		රු. 750 දක්වා රු. ශත	රු. 751 ට සිට රු. 1,500 දක්වා රු. ශත	රු. 1501 ට වැඩි රු. ශත
35.	වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම, ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
36.	කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
37.	කිලෝග්‍රෑම් 105ට වැඩියෙන් තේ කුඩු ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
38.	වෑල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
39.	ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40.	තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41	කෘෂි රසායනික පොහොර ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
42.	වායුසමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සේවා කරන හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
43.	විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
44.	කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
45.	සම්පදම් කිරීම	500 0	750 0	1,000 0
46.	සත්ත්ව පාලනය (මස් කිරි හෝ බිත්තර)	500 0	750 0	1,000 0
47.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
48.	පශු වෛද්‍ය ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
49.	විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හා ආහාර ද්‍රව්‍ය ගබා කර තැබීම	500 0	750 0	1,000 0
50.	කරවල ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
51.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩා කර තැබීම	500 0	750 0	1,000 0
52.	දුම්කොළ සකස් කිරීම් හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
53.	සත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
54.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝ ග්‍රෑම් 200 ට වැඩිප්‍රමාණයක් ගඩබා කිරීම	500 0	750 0	1,000 0
55.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
56.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
57.	අලුත් හෝ පරණ ලෝහ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
58.	සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
59.	රසකැවිලි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
60.	පොල්ලෙලි පෙඟවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
61.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0

අනු. අංකය	*බලපත්‍රයේ ස්වභාවය*	*වාර්ෂික වට්ටනාකම*		
		රු. 750 දක්වා රු. ශත	*රු. 751 ට සිට රු. 1,500 දක්වා රු. ශත*	*රු. 1501 ට වැඩි රු. ශත*
62.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
63.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
64.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
65.	විනාකිරි නිපදවීම හා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
66.	යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දූව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
67.	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ	500 0	750 0	1,000 0
68.	නිෂ්පාදනය හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
69.	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
70.	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
71.	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින් කිරීම	500 0	750 0	1,000 0
72.	මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග,මාශ බෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම් හලක්	500 0	750 0	1,000 0
73.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
74.	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
75.	ලියන තීන්ත අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
76.	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
77.	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
78.	සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
79.	පාසල් රට හුණු නිපදවීම	500 0	750 0	1,000 0
80.	ටයර් ටියුබ් හෝ 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
81.	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
82.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
83.	සිමෙන්ති කිලෝග්‍රෑම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0
84.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
85.	ප්ලාස්ටින් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
86.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
87.	පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍ය දමා තිබූ ගෝනි පිරිසිදු කර අලෙවිය	500 0	750 0	1,000 0
88.	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම	500 0	750 0	1,000 0
89.	ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම	500 0	750 0	1,000 0

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහ සහතික ලබාදෙනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පැවති මහා සභාවේ තීරණ අංක 05:3 යටතේ යෝජනාව සභා සම්මත වී ඇත. ඒ අනුව සභාව විසින් ලබාදෙනු ලබන සහතිකයක් හෝ සේවාව වෙනුවෙන් ගාස්තු නියම කර පහත සඳහන් ආකාරයට විය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් සහතිකයක් හෝ සේවාවක් ලබා දීම සඳහා එම උපලේඛනය 2 වන තීරුවේ ඒ ඒ සහතිකය හෝ සේවාව සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා තැනැත්තෙක් විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව කොටගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවට සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම

1. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දවස් හතකට කලින් අවසර පත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම්පතක් සභාවට ඉදිරිපත් කළ යුතුය. එම ඉල්ලුම්පත්‍රය පහත දේවල්වලින් සමන්විත විය යුතුය.

- ලේකම් මහතා වෙත යොමු කළ ලිඛිත ඉල්ලුම් පත්‍රය
- දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන පරිමිතියේ පිහිටීමට සාපේක්ෂව 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම
- 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූපසටහනක්
- එම සැලැස්මේ රූප සටහනේ හෝ නිර්මිතයෙහි අනුකූලව සංශෝධන
- ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමේ යොදා ගන්නා වර්ණ සියල්ල යොදා කුඩා පරිමාණයකට අඳින ලද එම දැන්වීමේ පිටපතක්
- යාබද වීදිවලට සහ ප්‍රධාන සලකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමේ පිහිටීමේ දැක්වෙන සැලැස්මක්
- ප්‍රචාරක දැන්වීමට අදාළ සවිස්තරය හා අනන්‍යතාවය
- අනවසර බැනර් දැන්වීම් ඉවත් කිරීමේ බලය සභාව සතුවේ.

අංකය	*ගාස්තු විස්තරය*	*මුදල*	
		රු. ශත	*රු. ශත*
01.	**දැන්වීම් පුවරු සඳහා ගාස්තු**		
01.	දැන්වීම් පුවරු සඳහා ගාස්තු	01 වර්ග අඩි	200.00
	තාවකාලික දැන්වීම් පුවරු ගාස්තු	01 වර්ග අඩි	350.00
02.	පරිසර බලපත්‍ර ගාස්තුව	-	4,500.00
03.	පරිසර පරීක්ෂණ ගාස්තුව (උපරිම)	-	23,009.26
04.	**විථිරේඛා, නොපවරා ගැනීමේ සහ අයිතිය පිළිබඳ සහතික.**		
	සංවර්ධන ප්‍රදේශ	*නේවාසික*	*ව්‍යාපාර*
	විථිරේඛා සහතික - නේවාසික	2,000.00	2,000.00
	නොපවරා ගැනීමේ සහතික - නේවාසික	2,000.00	2,000.00
	අයිතිය පිළිබඳ සහතික - නේවාසික	2,000.00	2,000.00

අංකය	*ගාස්තු විස්තරය*	*මුදල*	
		රු. ශත	*රු. ශත*
	සංවර්ධනය නොවූ ප්‍රදේශ	*නේවාසික*	*ව්‍යාපාර*
	විටීරේඛා සහතික - නේවාසික	2,000.00	2,000.00
	නොපවරා ගැනීමේ සහතික - නේවාසික	2,000.00	2,000.00
	අයිතිය පිළිබඳ සහතික - නේවාසික	2,000.00	2,000.00
05.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	නේවාසික 2,500.00	ව්‍යාපාර 6,000.00
06.	*නම මාරු කිරීම්*	*නේවාසික*	*ව්‍යාපාර*
	ලියාපදිංචිය	3,000.00	6,000.00
	A. T. D. පෝරම	2,500.00	4,000.00
07.	JCB (ඉදිරිපස පැටවුම් යන්ත්‍රය කුළියට දීම)	01 පැයකට	4,500.00
08.	*ක්‍රීඩාංගණය ලබාදීම :*	*බල ප්‍රදේශය*	*බාහිර*
	පාසල් සඳහා	නිදහස්	1,000.00
	ක්‍රීඩා සමාජවලට	2,500.00	5,000.00
	අන්තර් සමාජ ක්‍රීඩා තරග සඳහා	2,500.00	5,000.00
	සංගීත සංදර්ශන	10,000.00	20,000.00
	විනෝද වැඩ සටහන් (කාර්නිවල්)	2,500.00	7,500.00
09.	*ආදාහනාගාර ගාස්තු*	*බල ප්‍රදේශය*	*බාහිර*
	ආදාහනය	21,000.00	24,000.00
10.	සුසාන භූමිය වෙන්කිරීම ගාස්තුව	-	3,500.00
11.	පාපැදි බලපත්‍ර ගාස්තුව		50.00
12.	කසළ බදු 1 Kg		25.00
13.	**ත්‍රී රෝද රථ ගාස්තු අයකිරීම**		
	පෙර ලියාපදිංචිය		5,000.00
	දිනකට		7 50
14.	විකුණුම් - කොම්පෝස්ට් පොහොර (1 Kg x 15)		15.00
15.	ජල සම්බන්ධතා ලබා දීමේ ගාස්තු		16,000.00
16.	**එළුවන් ප්‍රවාහනය කිරීමේ ගාස්තු**	*බල ප්‍රදේශය*	*බාහිර*
		3,500.00	4,000.00
17.	කුකුළු ව්‍යාපාරය වෙනුවෙන් කසළ ගාස්තු අයකිරීම		12,000.00
	එළමස් ප්‍රවාහන ගාස්තු		7,500.00
	ගවමස් ප්‍රවාහන ගාස්තු		40,000.00
18.	විදුලි නිර්දේශ කිරීමේ ගාස්තුව		1,500.00
19.	පුස්තකාල සාමාජික ගාස්තු/ සාමාජිකත්වය අලුත් කිරීම		50.00
20.	පුටු කුළියට ලබා දීම (එක් පුටුවක් සඳහා)		10.00
21.	ආහාර පිණිස/ උත්සව අවස්ථාවක් සඳහා සතුන් ඝාතනය කිරීම සඳහා අනුමත කිරීමේ ගාස්තු		1,000.00

අංකය	*ගාස්තු විස්තරය*	*මුදල*	
		රු. ශත	*රු. ශත*
22.	වීථිරේඛා සහතික/නොපවරා ගැනීමේ සහතික/අයිතිය පිළිබඳ සහතික/පිඹුරුපත් සහතික කර ගැනීම අයදුම්පත/ආදහනාගාර වෙන්කර ගැනීමේ ඉල්ලුම්පත/JCB රථය වෙන් කර ගැනීමේ ඉල්ලුම්පත/ ක්‍රීඩාපිටිය වෙන්කර ගැනීමේ ඉල්ලුම්පත/ වෙළඳ බලපත්‍ර ඉල්ලුම්පත	100.00	
23.	දඩ මුදල් පුස්තකාල	රු. 1.00 බැගින්	
	ප්‍රමාද කරන දිනකටම එක් පොතකට		
	අස්ථාන ගත කරනු ලබන පොතක් සඳහා වර්තමාන මිල හා දෙපාර්තමේන්තු ගාස්තු 25%ක්		
24.	පුවත් පත් විකිණීමේ ගාස්තු මිල ගණන් කැඳවීමෙන් පසු ඉහළ මිල ගණන යටතේ		

12-245/7

කොටගල ප්‍රාදේශීය සභාව

ජලය සැපයීමේ ගාස්තු - 2023 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය හා 126 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරන ලද්දා වූ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 (පළාත් පාලන) *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි 34 වැනි කාණ්ඩයේ 40 (1) අතුරු ව්‍යවස්ථාව යටතේ කොටගල ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන ජල සේවාවන් සඳහා පහත සඳහන් පරිදි, ජල ගාස්තුවක් 2023 වර්ෂය සඳහා පනවා අයකර, ගැනීමට 2022.11.08 දින පැවති මහ සභාවේ තීරණ අංක 05.03 ප්‍රකාරව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ජල මීටර් සවිකර ඇති ප්‍රදේශයන් හි (වටගොඩ/පතන/රත්නගිරිය) උපලේඛන පරිදි,

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

ගෘහස්ථ

මාසික පාරිභෝගික ඒකක	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව රු. ශත*	*සේවා ගාස්තුව රු. ශත*
00 - 05	8.00	100.00
06 - 10	16.00	
11 - 15	30.00	
16 - 20	50.00	
21 - 25	110.00	
26 - 30	160.00	
31 - 40	200.00	
41 - 50	240.00	
51 - 75	260.00	
75<	300.00	

රාජ්‍ය ආයතන /ව්‍යාපාරික/ හෝටල් :

මාසික ඒකක ගණන	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව*	*රාජ්‍ය/ව්‍යාපාරික සේවා ගාස්තුව*	*හෝටල් සඳහා සේවා ගාස්තුව*
00 - 10	35.00	150.00	250.00
11 - 20	45.00		
21 - 30	55.00		
31 - 40	65.00		
41 - 50	75.00		
51 - 60	85.00		
61 - 70	95.00		
71 - 80	105.00		
81 - 90	115.00		
91 - 100	125.00		

12-245/8

කොටගල ප්‍රාදේශීය සභාව

කොටගල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක සභාව පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තියෙන් සාදන ලද 2022 නොවැම්බර් මස 08 වැනි දින පැවති මහ සභාවේ දී තීරණ අංක 08 යටතේ සභා සම්මත විය. ඒ අනුව කොටගල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන උපදේශක කාරක සභා පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථා නිවේදනය මෙයින් පළ කරමි. එම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බලපාන බව මෙයින් දැනුම් දෙමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

01. මෙම කොටසේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන හා මහජන සුභ සාධක සේවා විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සහාය දක්වන සංවර්ධන උපදේශක කාරක සභා අතුරු ව්‍යවස්ථාව යැයි හඳුන්වනු ලැබේ.

02. මහ සභා තීරණයක් මත පත් කරනු ලබන මෙම උපදේශක කමිටුවේ සාමාජිකයින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් විය යුතු අතර, සිවිල් අයිතිවාසිකම්වල අනර්ථයක් සිදු නොකරන ලද පුද්ගලයන් විය යුතුය.

03. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් පත් කරනු ලැබූ සාමාජිකයන්ගේ ධුර කාලය වර්ෂයක් දක්වා බල පැවැත්වේ.

04. සංවර්ධන උපදේශක කාරක සභාවේ සාමාජිකයන් පත් කිරීමේ දී ඔවුන්ගේ කුමන හෝ කාර්යයන් සම්බන්ධයෙන් වුවද විශේෂ හැකියාවක් ඇත්නම් වඩාත් සුදුසු ය.

05. සුවිශේෂ හැකියාවන් ඇති පුද්ගලයන් සොයා ගැනීමට අපහසු අවස්ථාවල විවිධ කාර්යයන් සඳහා නිපුණත්වයක් දක්වන්නේ නම් මේ සඳහා පත් කළ හැකිය.

06. එසේ නොවන අවස්ථාවක දී සමාජ සත්කාර සේවයේ නියැලී සිටින පුද්ගලයින් ඒ සඳහා පත් කළ හැකිය.

07. මෙම සාමාජිකත්වය ස්වේච්ඡාවෙන් සිදු කරනු ලබන උපදේශන සේවාවකි.

සංවර්ධන උපදේශක කාරක සභාවේ කාර්යයන්

- ❖ සිවි අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම.
- ❖ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව කෙටුම්පත් කිරීම
- ❖ ඉටුකළ යුතු සංවර්ධන කාර්යයන් ප්‍රමුඛතාගත කිරීම
- ❖ හදිසි ආපදා සහන සැලසීම හා ආපදා වළක්වා ගැනීම
- ❖ ආදායම් උත්පාදන මාර්ග හා විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම.

08. වර්ෂයක් සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන උපදේශක කාරක සභාවේ නිල කාලය වසරකි.

09. කිසියම් සාමාජිකයෙකු උපදේශක කාරක සභාවෙන් ඉවත් වන්නේ නම් දැනුම් දීමක් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාට මාසයකට කලින් දැනුම් දිය යුතුය.

10. උපදේශක කාරක සභා රැස්වීම්වල දී ගණපූර්ණය පවත්වාගෙන යාම පිළිබඳව කමිටු සභාපතිවරයා විසින් සෑහීමකට පත්විය යුතුය.

අර්ථ කථනය :

උපදේශක කාරක සභාව :

සංවර්ධන කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමේ බලතල ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රදේශයේ සුවිශේෂ හැකියාවන් සහිත තැනැත්තෙකුගෙන් සමන්විත කමිටුව.

ධුරවල කාලය :

කමිටු සාමාජිකයන්ගේ රාජකාරිමය කාලය මෙයින් අදහස් වේ.

සුවිශේෂී හැකියාවන් :

සාමාජගත කාර්යයන්වල දී ඒවා හොඳින් කිරීමේ හැකියාව ඇති පුද්ගලයින් මෙයින් අදහස් වේ.

නිපුණතාව :

යම්කිසි කාර්යයක් මනාව කිරීමේ හැකියාව.

සිවිල් අයිතිවාසිකම් සඳහා අන්තර්ගතය

ජීවත් වීමේ දී වටපිටාව සමග සුහදශීලීව ජීවත්වන කිසිම සමාජ විරෝධී ක්‍රියාවකට සම්බන්ධ නොවූවන් මින් අදහස් වේ.

12-245/9

කොටගල ප්‍රාදේශීය සභාව

බල ප්‍රදේශය තුළ භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ සභා සම්මත කරන ලද යෝජනාව අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෞතික සලසුම්කරණයේ මාර්ග, ගොඩනැගිලි, මිහිදන් උයන්, ළිං වීදි ලාම්පු ප්‍රතිපත්තිය මහජනතාවට දැන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තිය

අරමුණු :

සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් මා නියෝජනය වන පරිදි සංවර්ධන කාර්යයන් ව්‍යාප්ත කිරීමට ජනතා සහභාගීත්වය ලබා ගැනීම තුළින් භෞතික සැලසුම්කරණය සඳහා ප්‍රමිතියානුකූල නිමාවක් ඇති කිරීම.

නිර්නායකයන් :

- ❖ ජන ඝනත්වය
- ❖ දුෂ්කරතාවයන්
- ❖ ජන ඉල්ලුම්
- ❖ ජනතා සහභාගීත්වය
- ❖ කාර්යය අවශ්‍යතාවයන්ගේ වැදගත්කම

ක්‍රමවේදය :

01. මාර්ග :

01. සියලුම මාර්ගවල වර්ෂයකට වතාවක් හෝ කාණු කැපීම, කාණු වල කුණු ගොඩ දැමීම, කාණු උරහිස පිරිසිදු කිරීම.
02. පළුදු සහිත මාර්ග වලින් 40% ක් පළුදු මැකීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අයවැය ලේඛනය මගින් ලබා දීම.
03. මාර්ගවල පාලම්, බෝක්කු අත්වැල් වර්ෂයකට වර්ණ ගැන්වීම.
04. ජනතා සහභාගීත්වයෙන් නව මාර්ග කැපීම, මාර්ග කැපීම, මාර්ග පුළුල් කිරීම, ඒවා *ගැසට් පත්‍රයට* ඇතුළත් කිරීම.
05. සෑම මාර්ගයක් ම නියෝජනය වන ආකාරයට ගොඩනැගිලි සීමා, වීථි සීමා *ගැසට්* කිරීම, මායිම් සළකුණු කිරීම.
06. මාර්ගවලට හානි කරන අයට අවශ්‍ය දඬුවම් ලබා දීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.
07. මාර්ග සීමාවලට මුහුණලා ඇති ගොඩනැගිලිවල පිරිසිදු භාවය පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ නිසි ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කිරීම.
08. මාර්ග අලුතින් කොන්ක්‍රීට් කිරීම, තාර දැමීම, කාණු සැදීම, ජල බස්නා ඇති කිරීම.
09. නාගරික කොටස්වල පදික වේදිකාව ඉදි කිරීම.
10. සභාව සතු මාර්ගවල හඳුනාගැනීමේ පුවරු සවි කිරීම.
11. අඩි පාරවල් වාහන ගමන් කළ හැකි මාර්ග බවට පත් කිරීම හා එම තත්ත්වයට ගෙන ඒමට සැලසුම් කිරීම.
12. වීදි ආලෝකකරණය.

02. මිහිදන් උයන් :

01. සියලුම සුසාන භූමිවල අයිතිය ප්‍රාදේශීය සභාවට ලබා ගැනීම
02. මායිම් නිරවුල්කර වැටවල් ඉදි කිරීම
03. ජනතා සහභාගීත්වයෙන් සුසාන භූමියේ දේහ මිහිදන් කරන ප්‍රදේශ හඳුනා ගැනීම
04. විශාලත්වය සහ මහජන කැමැත්ත මත සුසාන භූමිවල කොටසක් වාණිජ කටයුතු සඳහා ශාක වගා කිරීම
05. මරණාධාර සංගම්වල සහභාගිත්වයෙන් සුසාන භූමිවල මිහිදන් කරන දේහ පිළිබඳ තොරතුරු දින වකවානු සහිතව ලබාගෙන පුද්ගලයන්ගේ පුද්ගලික විස්තර සහිත ලේඛනයක් පවත්වාගෙන යාම
06. සිහිවටන ස්මාරක ඉදිකරන අය සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාදුන් අංකය එම සිහිවටන හා ස්මාරකවල සටහන් කිරීම
07. සුසාන භූමිය භාවිතා කරන්නන්ගේ සහභාගීත්වයෙන් වැටවල් සඳහා ශාඛා සිටුවීමට සැලැස්වීම
08. සුසාන භූමි නඩත්තු කාර්යයන්, මරණාධාර හා සුභසාධක සමිතිවලට පැවරීම.

03. ළිං සහ පිහිළි :

01. අලුතෙන් ඉදිකරන ළිං සහ පිහිළිවල පිහිටීමේ අයිතිය පවරා ගැනීම
02. ළිං හා පිහිළි ඉදිකිරීමේ දී ඒ සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීම
03. ඉදිකර ඇති ළිං පිහිළි සඳහා වාර්ෂිකව නඩත්තු වැඩසටහනක් සකස් කිරීම
04. අභාවයට යන ළිං හඳුනාගෙන ඒවා මහජන අවශ්‍යතාවයන් සඳහා පුනර්ජීවනය කිරීම
05. බෝවන රෝග පවතින කාලවල දී ජලයේ ගුණාත්මක භාවය රැකගැනීමට අවශ්‍ය ප්‍රතිකාර සැලසීම
06. අනාරක්ෂිත ගැඹුරු ළිං ආරක්ෂිත තත්ත්වයට පත් කිරීම
07. ළිං, පිහිළිවල ප්‍රවේශ මාර්ග ඉදි කිරීම සහ නඩත්තුව
08. නව ජල යෝජනා ක්‍රම ඇති වීම හේතු කොට ගෙන භාවිතයට නොගන්නා ළිං වසා දැමීම.

04. වීදි ලාම්පු ප්‍රතිපත්තිය :

01. ට්‍රාන්ස්පෝමරයේ ධාරිතාවයෙන් 3% ක් පුරවැසියාගේ පොදු අවශ්‍යතාවය, නගර අලංකරණය සඳහා වැඩි දියුණු කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
02. දියුණු ප්‍රදේශ ලෙස නම් කර ඇති ප්‍රදේශ සඳහා ප්‍රධාන මාර්ග, අතුරු මාර්ග, මංසන්ධි සඳහා වීදි ලාම්පු සවි කිරීම.
03. අනෙකුත් තදසන්න ප්‍රදේශවල මහජනයාගේ ඉල්ලීම මත වීදි ලාම්පු සවිකිරීම
04. ප්‍රාදේශීය සභාවේ හඳුනාගත් ප්‍රදේශ සඳහා මංසන්ධි, ආගමික ස්ථාන, රාජ්‍ය ගොඩනැගිලි පිහිටි ස්ථානවල වීදි ලාම්පු සවිකිරීම.
05. වීදි ලාම්පු දැල්වීම සහ නිවීම සඳහා මහජන දායකත්වය ලබා ගත හැකි ස්ථාන සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
06. මහජන ඉල්ලීම පරිදි සවි කරන වීදි ලාම්පුවල දිගුකාලීන පැවැත්ම, ආරක්ෂාකාරීත්වය සම්බන්ධ ගැටළු ඇති නොවුනහොත් වෙනත් වීදි ලාම්පු වල ආරක්ෂාව තහවුරු කිරීම හා නඩත්තු කිරීම සඳහා නිලධාරියෙකු පත් කිරීම.
07. වීදි ලාම්පු ලේඛනයක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
08. ක්‍රියා විරහිත වීදි ලාම්පු නඩත්තු කිරීම
09. දියුණු ප්‍රදේශ ලෙස නම් නොකරන ලද ප්‍රදේශවල වීදි ලාම්පු සවිකළ පසු දියුණු කළ ප්‍රදේශ ලෙස *ගැසට්* කිරීම
10. ඉඩම් කට්ටි කිරීමේ දී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන හරහාම අවශ්‍ය වීදි ලාම්පු සවි කිරීමට වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
11. ඉඩම් කට්ටි කිරීමේ දී එම ඉඩම් කට්ටි ප්‍රමාණය අනුව ඒ සඳහා අවශ්‍ය උපරිම ධාරිතාවයක ට්‍රාන්ස්පෝමර් සවි කිරීමට උපදෙස් දීම ට්‍රාන්ස්පෝමර් ධාරිතාවය හරහා උචිත ප්‍රමාණයට වීදි ලාම්පු සවි කිරීම
12. වීදි ලාම්පුවලට හානි කරන්නන් සඳහා දඬුවම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. වීදි ලාම්පු සවි කිරීමට සමගාමීව ප්‍රාදේශීය සභා ඒකක බල ගැන්වීම.

12-245/10

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද, ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වන උපවගන්තයේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ පළමුවන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත එම උපලේඛනයේ දෙවන තීරුවේ අනුරූපිත සටහනේ අනුරූපිත ප්‍රමාණය අනුව කර්මාන්ත බද්දක් 2023 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමටත් එම කර්මාන්ත බදු 2023 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

උපලේඛන

I වැනි තීරුව	*II වැනි තීරුව* *රු. ශත*
වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක	500 0
වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක	750 0
වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක	1,000 0

12-245/11

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වාහන හා සතුන් මත බදු පැනවීම

කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී යෝජනා අංක 05:3 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මේ බද්දට යටත් වන කිසියම් වාහනයක් හෝ සතෙකු තබා ගන්නා සෑම තැනැත්තෙකු ම විසින්, එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2023 වර්ෂය සඳහා වන මෙම බද්ද කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ 4 වන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව කොටගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේ දී පහත උපලේඛනයේ පළමුවන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනේ නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමට කොටගල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*
	රු. ශ.
මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ම	25 0
සෑම බයිසිකල් හෝ ට්‍රයිසිකල් හෝ බයිසිකල් කාර්යයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
(අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම්	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් කරත්තයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීම්වලින් නිදහස් කෙරේ.

මෙහි උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට විකිණීම සඳහා හෝ අන් ආකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැනහොන්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ යම් ලිඛිත *නැනහොන්* ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12-245/12

කොටගල ප්‍රාදේශීය සභාව

පරිසර ආරක්ෂණ ගාස්තු - 2023 වර්ෂය

2000 අංක 53 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2022 පෙබරවාර මස 24 වැනි දින සිට මෙහි පළමුවැනි සභාව වෙත පවරා ඇති බලතල මත කොටගල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත ආරම්භ කර පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ සඳහන්වන කර්මාන්ත සම්බන්ධයෙන් ඉහත කී පනතේ අදළ සංශෝධිත යටතේ පවරා ඇති රෙගුලාසිවලට අදළව එකී ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන්නන් විසින් 2023 වර්ෂයට බලපත්‍රයක් ලබාගත යුතු බවට 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පැවති මහා සභා තීරණ අංක 05.3 යටතේ තීරණය කර ඇති බැවින්, ඒ සඳහා පහත දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි. අදළ රෙගුලාසිවලට අනුකූලව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම කොටගල ප්‍රාදේශීය සභාව සතුයි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

අංක	*ආයෝජන*	*පරීක්ෂණ ගාස්තු* *රු. ශත*
1	රු. 2,50,000.00 හෝ ඊට වැඩි	3,472.22 + රජය විසින් අනුමත කරන ලද බදු
2	රු. 2,50,001.00 - 5,00,000.00 දක්වා	4,305.56 + රජය විසින් අනුමත කරන ලද බදු
3	රු. 5,00,001.00 - 10,00,000.00	5,740.74 + රජය විසින් අනුමත කරන ලද බදු
4	රු. 10,00,000 ට වැඩි	11,527.78 + රජය විසින් අනුමත කරන ලද බදු
5	රු. 10,000,001 හෝ ඊට වැඩි ප්‍රමාණය	23,009.26 + රජය විසින් අනුමත කරන ලද බදු

පරිසර බලපත්‍ර ගාස්තු ගෙවීම

"ඇ" කාණ්ඩය (වසර තුනක් සඳහා රුපියල් 4,500.00)

සභාව විසින් අයදුම්පත්‍ර නිකුත් කිරීමේ දී රු. 250.00 (මාර්ගගත ක්‍රමයට නොමිලේ අයදුම් පත් ලබා ගැනීමට https://www.cea.lk)

ඇ කොටස

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලිය සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 25 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළීමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂී ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ 10 ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්"
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
    * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + [50 x ඌරන් සංඛ්‍යාව + ගවයන් සංඛ්‍යාව + 10 x (එළුවන් සංඛ්‍යාව)]
20. ගබඩා ධාරිතාවය සත මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ''ප්ලාස්ටර් ඔෆ් පැරිස්'' අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ/පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු

27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළුගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත

29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු

30. දිනකට සත මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවයක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත

31. දැව පදම් කිරීම් සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත

32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත

33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩි සහ 100ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම් හල්

35. විසිරි පින්තාරු කිරීමේ හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ

36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත

37. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

38. මෘත ශරීර කල්තබා ගැනීමට සකස් කිරීම සහිත මල්ශාලා

39. මෙම උපලේඛනයේ "ඈ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක්/කර්මාන්තයක්

12-245/13

කොටගල ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 වැනි අධිකාරය යටතේ කොටගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතලල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොවූ ඉඩම් සඳහා ඒ වන විට පවත්නා වාණිජ වටිනාකමින් 2% බද්දක් අයකර ගැනීමට කොටගල ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස 08 වැනි දින පවත්වන ලද මහා සභාවේ තීරණ අංක 05:3 යටතේ තීරණය කර ඇත. අදාළ ඉඩම් හිමිකරුවන් විසින් එම බද්ද කොටගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව නිවේදනය කරමි.

රාජමනී ප්‍රසාන්ත්,
සභාපති,
කොටගල ප්‍රාදේශීය සභාව.

2022 නොවැම්බර් මස 08 වැනි දින,
කොටගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-245/14

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සඳහා 2023 වර්ෂයට අදාළ වරිපනම් බදු නියම කිරීමට 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් සහ ගෙපතක් මත 2022 වර්ෂයේ දී පැවති වාර්ෂික වටිනාකම 2023 වර්ෂය සඳහා ද පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ පළමුවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත දක්වා ඇති I, II සහ III යන උපලේඛනවල සඳහන් මාර්ගයන් හා පාරවල් දෙපස ඇති දේපල මත පිළිවෙලින් වූ වාර්ෂික වටිනාකම මත 10%ක් 6%ක් සහ 4% ක් ලෙස වරිපනම් බද්දක් පනවා අයකිරීමට ත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134(6) උපවගන්තියෙන් පනවා ඇති විධිවිධාන ප්‍රකාරව 2023 වර්ෂයේ -

වර්ෂය	කාර්තුව	කාර්තුවට අයත් කාලය
2023	I වැනි කාර්තුව	ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා
2023	II වැනි කාර්තුව	අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා
2023	III වැනි කාර්තුව	ජූලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා
2023	IV වැනි කාර්තුව	ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා

වගුවේ ඇතුළත් දිනවලින් අවසන්වන කාර්තු හතර (4) තුළ දී වාරික හතරකින් (4) ගෙවීමටත්,

2023 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2023 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු මුදල ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබීමට ත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I වැනි උපලේඛනය- වාර්ෂික වටිනාකමෙන් 10% බැගින් :

1. කටුගස්තොට පාර
2. විගුහුම්පල පාර
3. කුරුණෑගල පාර
4. නුවර පාර

II වැනි උපලේඛනය - වාර්ෂික වටිනාකමෙන් 6% බැගින් :

1. බරිගම පාර
2. බෝලගල පාර
3. කුලුගම්මන පාර
4. වතුවල එඩරුතැන්න පාර
5. ගොහාගොඩ පාර
6. ගන්නෝරුව පාර
7. රණවන පාර
8. නුගවෙල විද්‍යාල පාර

III වැනි උපලේඛනය- වාර්ෂික වටිනාකමෙන් 4% බැගින් :

01. බෝගහකන්ද පාර
02. කැටපිඬැල්ල පාර
03. පල්ලේගම පාර
04. ග්‍රාම සංවර්ධන පාර
05. ජනරජ මාවත
06. ජයන්ති පාර
07. මඩපත පාර/ රෑනකෙටුගල පාර
08. සියඹලාඇත්ත පාර
09. හමංගොඩ පාර
10. පිටියේගෙදර පාර
11. සෙනරත්ගම සුසානභූමි පාර
12. ඉනිගල කොණ්ඩදෙනිය පාර
13. ඉනිගල පාසල පාර
14. පෙරිහිල්වත්ත පාර
15. ගලේ පන්සල පාර
16. බටුඅඹේ කොළනිය පාර
17. මාලගම්මන පාර
18. මීගස්දෙනිය පාර
19. උග්ගල්ල පාර
20. උගුරැස්සපිටිය
21. උගුරැස්සපිටිය කොණ්ඩදෙනිය පාර
22. උගුරැස්සපිටිය වෑංග පාර
23. උල්ලඳුපිටිය පාර
24. වැලියද්ද පාර
25. විජේසිරි මාවත
26. සිරිවර්ධනාරාම පාර
27. සෙනරත්ගම උඩුවාවල පාර
28. හීනාගම කොණ්ඩදෙනිය පාර
29. පූජාපිටිය පාර
30. දොරණෑගම පාර
31. රජපිහිල්ල පාර (මැදවල)
32. හෑදෙනිය පාර
33. බුලත්ගොල්ල පාර
34. සුමනතිස්ස පාර
35. කොටුවේවත්ත පාර
36. ඔයතැන්න පාර
37. රජපිහිල්ල පාර (රණවන)
38. රාජසන්තක පාර
39. උඩුවාවල යටිවාවල පාර
40. උඩුවාවල සෙනරත්ගම පාර

41. සමගි මාවත
42. හපුගොඩ පාර
43. හපුගොඩ පාසල් පාර
44. අලදෙනිය පේරාදෙණිය පාර
45. අලදෙනිය බලවත්ගොඩ පාර
46. මැදවල පාර.

12-03/1

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

2023 වර්ෂය සඳහා බලපත්‍ර මත ගාස්තු පැනවීම

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස 19 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05.02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2023 වර්ෂයේ දී හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් මතම බලපත්‍ර ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2023 වර්ෂය සඳහා බලපත්‍ර මත පනවන ලද බලපත්‍ර ගාස්තු 2023 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව,
තිත්තපජ්ජල, වැරැල්ලගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 දිනැති අංක 520/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත I වැනි තීරුවේ සඳහන් එක් එක් කාර්යයන් වෙනුවෙන්, II වැනි තීරුවේ අනුරූප සටහනෙ හි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තු පනවා අය කිරීමට ත්,

යම් ස්ථානයක් හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් හා 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද, අවස්ථාවක ඊට පෙරාතුව වූ අවුරුද්දේ එකී ව්‍යාපාරයේ ඉපයූ ආදායමෙන් 1% ක ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම රු. ශත		
		රු. 750ට අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,501 ට වැඩි රු. ශත
1.	ලැගුම් නිවාස	500 0	750 0	1,000 0
2.	හෝටල්	500 0	750 0	1,000 0
3.	බත් කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි	500 0	750 0	1,000 0
4.	බේකරි	500 0	750 0	1,000 0
5.	කිරිපට්ටි හා කිරි වෙළෙඳාම	500 0	750 0	1,000 0
6.	ආහාර විකිණීම	500 0	750 0	1,000 0

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126(ix) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.02.23 දිනැති අංක 1955/7 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2019.11.08 වැනි දින අංක 2149 *ගැසට් පත්‍රය* මගින් වැළඳ ගෙන ඇති පරිදි හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 147 වැනි වගන්තිය සමග සම්මත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පහත I වැනි තීරුවේ සඳහන් එක් එක් කාර්යයන් වෙනුවෙන්, II වැනි තීරුවේ අනුරූප සටහනෙ හි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2023 වර්ෂයට පනවා අය කිරීමට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

I වැනි උපලේඛනය

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම රු. ශත		
		රු. 750ට අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,501ට වැඩි රු. ශත
පීඩාකාරී ව්‍යාපාර :				
1.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
2.	මස් විකිණීම	500 0	750 0	1,000 0
3.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
4.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
5.	සම් විකිණීම	500 0	750 0	1,000 0
6.	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
7.	ඡායාරූප ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
8.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
9.	විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
10.	කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම	500 0	750 0	1,000 0
11.	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
12.	දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
13.	සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
14.	පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
16.	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම	500 0	750 0	1,000 0
17.	අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
19.	ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම	500 0	750 0	1,000 0
20.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
21.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

අනු. අංකය	කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය	I වැනි තීරුව	II වැනි තීරුව	
		වාර්ෂික වටිනාකම රු. ශත		
		රු. 750ට අඩු රු. ශත	රු. 751 - රු.1,500 රු. ශත	රු.1,501 ට වැඩි රු. ශත
22.	සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
23.	රසකැවිලි වර්ග නිපදවීම හා විකිණීම	500 0	750 0	1,000 0
24.	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
25.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
26.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
27.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
28.	විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
